# යශෝරාවය

විදුහලේ දැක්ම

අභියෝග හමුවේ
නොසැලෙන
ගුණ නැණින් සුපෝෂිත
අභිමානවත්
දිරිය දියණියන්

ත්‍රෛමාසික පුවත්පත

හතර වන කාණ්ඩය තෙවන කලාපය - 2019 සැප්තැම්බර්, ඔක්තෝම්බර්, නොවැම්බර්

මිල රු. 25/=



දුරකථනය:- 033 2222746 ෆැක්ස්:- 033 2222746 ඊමේල්:- gmydbv@gampahait.sch.lk වෙබ් අඩවිය:- www.yasodaradevibalika.edu.lk


## වාර්ෂික ත්‍යාග ප්‍රදානෝත්සවය 2018



2018 ත්‍යාග ප්‍රදානෝත්සවය, 2019 නොවැම්බර් මස 28 වන දින විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේදී පැවැත්විණ. කොළඹ විශ්ව විද්‍යාලයේ විද්‍යා පීඨයේ පීඨාධිපති මහාචාර්ය රංජිත් මහානාම මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ද සහකාර පොලිස් අධිකාරී බස්නායක මහතාගේ විශේෂ සහභාගීත්වයෙන් ද පැවැති මෙම උත්සවයේදී ඩී.එස්. තාරුකා කුමාරි ශිෂ්‍යාව වසරේ දක්ෂතම ශිෂ්‍යාවට හිමි සම්මානය දිනාගත්තාය.



රජ සැප පිණිස නොව සසුනේ දියුණුවට
මම යුධ වදිමි දැය එක්සත් කිරීමට
අදිටන තබා ලේ මස් ඇට මිදුළු යට
ජය දද නගා මහ සෑ නැගුණි අහසට

* * * * *

තම යහපතට නොව විදුබිම දියුණුවට
අපි වැඩ කරමු සිප් සත් සරු කිරීමට
අදිටන තබා ලේ මස් ඇට මිඳුළු යට
යසෝදරාවන් පුදනෙමු ජාතියට

## ප්‍රාථමික අංශයේ ත්‍යාග ප්‍රදානෝත්සවය

2019.10.15 වන දින ප්‍රාථමික අංශයේ ත්‍යාග ප්‍රදානෝත්සවය "යසෝ පැහැසර" නමින් විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේදී අති උත්කර්ෂවත් අන්දමින් පැවැත්විණ. එවකට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ අනුර ප්‍රේමලාල් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් හා විශ්‍රාමික, ගම්පහ කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ සුසන්ත ගුණතිලක මැතිතුමාගේ විශේෂ සහභාගීත්වයෙන් පැවැති මෙම උලෙලේදී ප්‍රාථමික අංශයේ දක්ෂතා දැක්වූ ශිෂ්‍යාවෝ ත්‍යාග හා සහතික පත් දිනා ගත්හ.



## සමස්තලංකා බැඩ්මින්ටන් ජය යසෝදරාවට



2019 සැප්තැම්බර් මස 5,6,7 යන දිනවල කෑගල්ල නගර සභා ශෘහස්ථ ක්‍රීඩාංගනයේදී පැවති සමස්තලංකා බැඩ්මින්ටන් තරගාවලියේදී වයස අවුරුදු 19න් පහළ ඊ කාණ්ඩයේ ශූරතාව දිනා ගැනීමට අප විද්‍යාලයීය බැඩ්මින්ටන් කණ්ඩායම සමත් විය. ජයග්‍රහණය සඳහා ශිෂ්‍යාවන් මෙහෙයවූ ක්‍රීඩා භාර ආචාරිනී ඉෂාණි ගමගේ ගුරු මහත්මිය ඇතුළු ක්‍රීඩා සංගමයේ සියලුම ගුරු මහත්ම මහත්මීන්ටත් ජයග්‍රාහිකාවන්ටත් සුබ පැතුම් පිරිනමමු.

## සමස්තලංකා සංගීත තරගයෙන් දෙවන ස්ථානය

2019 සමස්ත ලංකා සංගීත තරගාවලියේදී අප විද්‍යාලය විසින් ඉදිරිපත් කරන ලද රාගධාරී සංගීතය ආශ්‍රිත ස්වතන්ත්‍ර නිර්මාණය, සමූහ වාදන අංශයෙන් සමස්තලංකා දෙවන ස්ථානයත් හොඳම නිර්මාණයට හිමි සම්මානයත් දිනා ගැනීමට සමත් විය. සිතාරි විතානගේ ගුරු මහත්මිය ඇතුළු සංගීත අංශයේ ගුරු මහත්මීන්ගේ නොමඳ කැපවීම ශිෂ්‍යාවන් ජයග්‍රහණය කරා මෙහෙයවීය. ඉදිරි ජයග්‍රහණ සඳහා විද්‍යාලයේ උණුසුම් සුබ පැතුම් පිරිනමමු.



## 2019 ශිෂ්‍යත්ව විභාගයෙන් විශිෂ්ට ජයක්

2019 ශිෂ්‍යත්ව විභාගය සඳහා මුහුණ දුන් ශිෂ්‍යාවන් අතරින් ශිෂ්‍යාවන් 49 දෙනෙකු ලකුණු 159 ඉක්මවා ලබා ගැනීමට සමත් වූ අතර, නෙතුකි සහස්නා රත්නායක ශිෂ්‍යාව විද්‍යාලයේ ඉහළම ලකුණ වූ ලකුණු 187 ලබා ගැනීමට සමත් වූවාය. ලකුණු 70 ඉක්මවා ලබාගත් ශිෂ්‍ය ප්‍රතිශතය 98.5% වන අතර මෙය විද්‍යාලයීය ඉතිහාසයේ ඉහළම ප්‍රතිඵලයකි.

2 වන පිටුවට

## මෙවරත් උසස් පෙළින් විශිෂ්ට ප්‍රතිඵල

ජයග්‍රාහී ඉතිහාසයකට උරුමකම් කියන ගම්පහ යසෝදරාදේවි බාලිකාවෝ මෙවරද උසස් පෙළ විභාගයෙන් විශිෂ්ට ජයග්‍රහණ රැසක් අත්පත් කර ගත්හ. එහිදී වාණිජ අංශයෙන් ගම්පහ දිස්ත්‍රික් ප්‍රථම ස්ථානය දිනා ගැනීමට එම්.කේ. පවනි නිමාෂා ශිෂ්‍යාවත් ජීව විද්‍යා අංශයෙන් ගම්පහ දිස්ත්‍රික් හත් වන ස්ථානය දිනා ගැනීමට එම්.එල්. සචිනි වත්සලා ශිෂ්‍යාවත්

2 වන පිටුවට



# කතුවැකිය

ගුරුවරයෙක් සිසුවකු හට එක්තරා පැවරුමක් ලබා දුන්නේය. පැවරුමක්.........? කුමක්ද ඒ පැවරුම?

''පුතා, හරි හතරැස් කඩදාසියක් ගෙන්න.

සිසුවා ගුරුවරයාගේ අණ ඉටු කළේය. හරි හතරැස් කඩදාසියේ ගුරුවරයා ලෝකයේ සැකැස්ම සටහන් කළේය. සිසුවා ගුරුවරයා කරන දෙය දෙස විමසිලිමත්ව බලා සිටියේය. මන්ද මෙකී ගුරුවරයා නව දැනුමින් තමා පෝෂණය කරන්නෙකු බව සිසුවා අත්දැකීමෙන් දන්නා නිසාය.

කොළයේ අනිත් පිට පෙරළූ ගුරුවරයා එහි තවත් යමක් සටහන් කළේය. ඉන්පසු කොළය කැබලිවලට ඉරා දැමුවේය. සිසුවා විස්මයෙන් බලා සිටියේය.

''පුතා........ මේ කොළ කැබලිවල තියෙන්නේ ලෝකයේ කොටස්.... පුතාට පුළුවන්ද මේ කොළ කැබලි එකට තියල ලෝකය හදන්න''.

සිසුවා අභියෝගය භාර ගත්තේය. ඔව්, උතුරු ඇමරිකාව, දකුණු ඇමරිකාව, ආසියාව, යුරෝපය, අප්‍රිකාව.... සිසුවා කොළ කැබලි එකට එක තබමන් ලෝකය නිර්මාණය කරන්නට උත්සාහ කළේය. ගුරුවරයා සිසුවා දෙස බලා සිටියේ සිහින් සිනහවක් මුවඟ රඳවා ගනිමිනි. පැයක පමණ වෙහෙසකර ප්‍රයත්නයකින් පසු සිසුවාගේ නළලෙහි සිහින් දාඩිය බිඳු කිහිපයක් මතු වී තිබුණි.

''අමාරුයි සර්.''

සිසුවා කීවේ බිඳුණු හඬකිනි.

''ගේන්න පුතා කොළ කෑලි ටික.''

ගුරුවරයා කාරුණික ස්වරයෙන් ආමන්ත්‍රණය කළේය. කොළ කැබලි කිහිපය අනෙක් පිටට හැරවූ ගුරුවරයා යමක් නිර්මාණය කරන අයුරු සිසුවා බලා සිටියේ කුතුහලයෙනි.

''බලන්න පුතා, මේක අනිත් පැත්තෙ ඉන්නේ ළමයෙක්. මුහුණ, අත්පා සිරුරෙ අනෙකුත් කොටස් හරියටම තියල මේක අනිත් පැත්ත හරවන්න. දැන් බලන්න මොකද වෙලා තියෙන්නේ කියලා...''

''ආ.... පුදුමයි..... ලෝකය නිර්මාණය වෙලා....!''

සිසුවා ප්‍රීතියෙන් කෑ ගැසුවේය.

''ඔව් පුතා...., පුතා හරියට හැදුණොතින් තමයි

ලෝකය හරියට හැදෙන්නේ...''

ගුරුවරයා සෙනෙහසින් සිසුවාගේ හිස අත ගෑවේය. ඔහුගේ හදෙන් නැගුණ පබසර කිරණ හාත්පස ආලෝකවත් කරමින් විශ්වයේ අනන්තය කරා පැතිර ගියේය.

අධිෂ්ඨානශීලී බව උපරිම සාර්ථකත්වයට හේතුවේ.

**විදුහල්පතිනියගෙන්...**

මුල පිටුවෙන්

## 2019 ශිෂ්‍යත්ව විභාගයෙන් විශිෂ්ට ජයක්

**සමීර ලියනගේ ඇතුළු ප්‍රාථමික අංශයේ සියලුම ගුරු මහත්මීන්ගේ නොමද කැපවීමේ ප්‍රතිඵලයක් වූ මෙම ජයග්‍රහණය සියලු පාසල් ප්‍රජාවගේ ප්‍රශංසාවට බඳුන් විය. ඉදිරි ජයග්‍රහණ සඳහා හෘදයංගම ශුභ ප්‍රාර්ථනා මෙසේ ගෙන එමු.**

## මෙවරත් උසස් පෙළින් විශිෂ්ට ප්‍රතිඵල

**කලා අංශයෙන් ගම්පහ දිස්ත්‍රික් අට වන ස්ථානය දිනා ගැනීමට ජේ.එම්. නුරාෂා ඉඳුමිණි ශිෂ්‍යාවත් සමත් වූහ.**

**සමස්ත විද්‍යාලයීය සමත් ප්‍රතිශතය 85% ක් පමණ වන අතර විශ්ව විද්‍යාලයට ඇතුළත් වීම සඳහා සුදුසුකම් ලැබූ ප්‍රතිශතය 40% ක් පමණ වේ. එසේම වාණිජ අංශයේ ශිෂ්‍යාවන් 54 දෙනෙක්, කලා අංශයේ ශිෂ්‍යාවන් 49 දෙනෙක්, විද්‍යා අංශයේ ශිෂ්‍යාවන් 10 දෙනෙක් ලෙස ශිෂ්‍යාවන් 113 දෙනෙක්, A3 සහ A3 හි අවම (ඉසෙඩ්) අගයට වඩා ප්‍රතිඵල ලබා ගත්හ. එසේම ඉංජිනේරු පීඨයට ශිෂ්‍යාවන් 10 දෙනෙක් ද නීති පීඨයට ශිෂ්‍යාවන් 11 දෙනෙක්ද තේරී පත්වීම විද්‍යාලයට ලද විශිෂ්ට ජයග්‍රහණයකි.**

## සංස්කාරක මණ්ඩලය

**ප්‍රධාන උපදේශක** - එච්.එම්. ගයානි වත්සලා මිය (විදුහල්පතිනිය)

**සංස්කාරක මණ්ඩලය** -
1. මාධවී රූපසිංහ මිය (සහකාර විදුහල්පතිනිය)
2. සුමුදු හේරත් මිය
3. විචිත්‍රා මාපිටිගම මිය
4. චින්තා කුමාරිහාමි මිය
5. කේ.ඒ. රසිකා සිරිවර්ධන මිය

**සිසු කමිටුව** -
1. ඊ.ඒ. හංසනී පියුමිකා
2. කේ.කේ. සියුමි සෙව්මිණී කීරවැල්ල
3. නෆීෂා අෆ්ෂාරා අහමට්
4. හිරුෂි අමාෂා
5. ලක්ෂාණි නෙත්මි
6. පබසරා සෙව්වන්දි
7. අයෝධ්‍යා යොමාලි
8. හිරුණි පූර්ණිකා
9. තරුෂි පූර්ණිමා
10. ශනාලි තත්සරණි
11. කල්පනා විජයලත්
12. හංසිකා රත්නායක

හත් වතාවක් වැටෙන්න නමුත් අටවෙනි වතාවේ නැගිටින්න.

යශෝරාවය
ත්‍රෛමාසික පුවත්පත

# සදහම් පණිවිඩය

**අක්කෝධේන ජිනෙ කෝධං**
**අසාධුං සාධුනා ජිනෙ**
**ජිනෙ කදරියං දානේන**
**සච්චෙන අලික වාදිනං** (ධම්මපදය - ක්‍රෝධ වග්ගය)

වෛරකරන්නා අවෛරයෙන් ජයගත යුතුය
අසත්පුරුෂයා සත්පුරුෂකමින් ජයගත යුතුය
මසුරුතැනැත්තා දානයෙන් ජයගත යුතුය
බොරු කියන්නා සත්‍යයෙන් ජයගත යුතුය

පුද්ගලයාගේ ස්වභාවය නිරායාසයෙන්ම වැරදි මගට යොමු වීමයි. වෛර කිරීමට, ඊර්ෂ්‍යා කිරීමට, ලෝභවීමට බොරු කිරීමට පුහුණුවක් අධ්‍යාපනයක් අවශ්‍ය නැත. ඒවා උපතින්ම රැගෙන එයි. අනායාසයෙන් සිදුවෙයි. එහෙත් යහපත් දෙය අයාසයෙන් පුරුදු පුහුණු කළ යුතු වෙයි. ලෝකයේ කිසිදිනෙක වෛරය වෛරයෙන්ම දිනූ කෙනෙක් ජයගත් කෙනෙක් නැත. වෛරයට ක්‍රෝධයට වෛරයෙන් ක්‍රෝධයෙන් පිළිතුරු දීමට යාමෙන් සිදුවන්නේ ක්‍රෝධය වෛරය ගින්නක් බවට පත්වී තමා සමඟ සියල්ලන්ම දවා හළු කිරීමයි. වෛරයට ක්‍රෝධයට ප්‍රතිපක්ෂ ධර්මය මෛත්‍රියයි, නැතහොත් හිතවත් කමයි. මෛත්‍රී කිරීම, හිතවත් වීම පහසු කරුණක් නොවේ. එය වචනයෙන් කීමට නොව හදවතේ ගැඹුරුම තැනින් මතුකර ගැනීමට උත්සාහ ගැනීම අවශ්‍යය. මවක තමාගේ එකම දරුවා සුරකින්නා සේ එක ඇසක් ඇත්තෙකු ඒ ඇස සුරකින්නා සේ අන්‍යයන් පිළිබඳ සිතීමට උත්සාහ ගැනීම මනුස්සකම බව මේ ගාථාව කියා දෙයි. තමාගේ පරම හතුරාත් එතන සිටියි.

අසත් පුරුෂයා සත්පුරුෂ කමින් ජයගැනීමට උත්සාහ කළ යුතුය. අසත් පුරුෂයා යනු මුහුණට හිතවත්කම පෙන්නා නැති තැන දොස් කියන, හොර රහසේ ගැටලු ඇතිකරන කුහක, ගුණමකු, කපටි ලාමක ගති ඇති ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයමය. මේ සූක්ෂම වංචාකාරයන් හඳුනා ගැනීම ඉතා අසීරුය එහෙත් තමා අවංකනම් හදවතට එකඟව සිහියෙන් කටයුතු කරන්නේ නම් අසත්පුරුෂයන්ට කළ හැකි දෙයක් නැත. සත්පුරුෂ ධර්මය වන්නේ මෛත්‍රිය, කරුණාව, මුදිතාව, සිහිය, අවංක බව, ගුණමකු නොවීම, ආදී සදාචාර ධර්මයන්ය. ධර්මයෙහි හැසිරෙන්නා ධර්මයෙන්ම ආරක්ෂා වෙනවා යයි ධර්මයේ සඳහන් වන්නේ මේ නිසාය.

දානය යනු දීමයි. කිසිදු ලෞකික බලාපොරොත්තුවක් නොමැතිව තමා සතු භෞතික හා අධ්‍යාත්මික සම්පත් පරිත්‍යාග කිරීම දානයයි. දානයට ප්‍රතිපක්ෂ වන්නේ ලෝභය හා මසුරුකමයි. ලෝභ තැනැත්තා තමාත් පරිහරණය නොකරයි අනුන්ටත් නොදෙයි. දීමේ වටිනාකම නම් ලැබීමයි. දීමේ වටිනාකම නොදන්නා තැනැත්තාට දීම හුරු කිරීමට ඔහුටද අන්‍යන්ටද දීම සුදුසුය. දීම ක්‍රම දෙකකි. එනම් පූජා බුද්ධියෙන් හා අනුග්‍රහ බුද්ධියෙන් දීමයි. ආමිස දානය යනු ජීවත්වීමට අවශ්‍ය භෞතික සම්පත් දීමයි. අභයදානය යනු මරණ භය නැති කිරීමයි. ජීවත්වීමේ අයිතිය ලබා දීමයි. ධර්මදානය යනු නොදන්නා යහපත් දේ කියා දීමයි. දීම යනු අතහැරීමයි. එයින්ම මසුරු කම දුරුවේ.

බොරු කියන්නා සත්‍යයෙන්ම ජයගත යුතුය. බොරුවට බොරුවෙන්ම පිළිතුරු දිය යුතුයයි වර්තමාන සමාජයේ මිත්‍යාවක් පිළිගෙන ඇතත් එය සත්‍ය නොවේ. බොරුව පුද්ගල සමාජ ව්‍යසනයකි. බොරු කියන්නාට නොකළ හැකි අපරාධයක් නැති බව ධර්මයේ සඳහන් වේ. තමා බොරු කියන බව කරන බව මුලු ලෝකයාම නොදැන හිටියත් තමා දන්නා කරුණකි. එයට ලැබෙන විපාක මේ ජීවිතයේදී ලැබේ. බෝසතුන් පාරමිතා පුරණා කාලයේ අනෙක් සියලු අකුසල් වැරදි බෝසතුන් අතින් සිදු වුවත් මොන ආකාරයෙන්වත් බොරු සිදු නොවුණ බව සඳහන් වේ. සත්‍ය වසන් කිරීමට උත්සාහ කලත් කවදා හෝ එළිවෙයි. එය වැලැක්විය නොහැකිය. එතනදී පසුතැවෙනවාට වඩා සත්‍යය ට මුහුණදීම වැදගත්ය. මේ දහම් කරුණු එදිනෙදා ජීවිතය සදාචාර සම්පන්න කරගෙන යහපත් පෞරුෂයක් ගොඩනගා ගැනීමටත් සැනසිලි දායක ජීවිතයක් ගතකිරීමටත් උපකාර වන බව සැලකිය යුතුය.

රත්නපුරේ දායාකුසුම් මෙහෙණින් වහන්සේ

# ජය දද නැංවූ යසෝදරාව

## Vivace Beat Band තරගාවලිය

2019 දෙසැම්බර් 27 වන දින පැවති කොළඹ ආනන්ද විද්‍යාලයීය බටහිර සංගීත අංශය විසින් සංවිධානය කරන ලද Vivace Beat Band තරගාවලියේදී අප විද්‍යාලයීය කණ්ඩායම බාලිකා අංශයේ ප්‍රථම ස්ථානය දිනාගත්තේය. බටහිර සංගීත විෂය භාර ඉරේෂා ජයකොඩි ගුරු මහත්මිය සිසුවියන් ජයග්‍රහණය කරා මෙහෙයවූවාය.

## 2019 විද්‍යා දැනුම මිනුම තරගාවලිය

සමාජ විද්‍යා විෂය භාර ගුරුභවතුන්ගේ මෙහෙයවීම යටතේ පුහුණුව ලැබූ 11 ශ්‍රේණියේ නිපුණි අමාෂා තල්ගස්ඕවිට ශිෂ්‍යාව 2019 විද්‍යා දැනුම මිනුම තරගාවලියේදී බස්නාහිර පළාතේ ප්‍රථම ස්ථානය හිමිකර ගැනීමට සමත් වූ අතර සමස්තලංකා තරගය සඳහා ද සුදුසුකම් ලැබුවාය.

## ජනාධිපති බාලදක්ෂිකාව

බාලදක්ෂිකා සංගමය භාර චම්පා රණබාහු ගුරු මෑණියන් ඇතුළු අනෙකුත් ගුරු මෑණිවරුන් යටතේ පුහුණුව ලැබූ දෙව්මිණි අයෝධ්‍යා රුද්‍රිගු ශිෂ්‍යාව ජනාධිපති බාලදක්ෂිකාවක ලෙස තේරී පත් වූවාය.

## අන්තර් පාඨශාලීය විවාද තරගාවලිය

ගම්පහ මහ නගර සභාව මගින් සංවිධානය කරන ලද අන්තර් පාඨශාලීය විවාද තරගාවලියේ තරග වට 32ක් අතරින් සමස්ත තරගාවලියේ 3 වන ස්ථානය දිනාගැනීමට අප විද්‍යාලයීය විවාද කණ්ඩායම සමත්ව ඇත. රශ්මි නිමාෂා සහ කාවින්දි දෙව්මිණි ජයවර්ධන යන ශිෂ්‍යාවෝ මෙහිදී හොඳම කථිකාවන් ලෙස ඇගයීමට පාත්‍ර වූහ. ආර්. හංසිකා රත්නායක, මෙලනි සත්‍යානි සහ කාවින්දි ගෝනපීනුවල කණ්ඩායම නියෝජනය කළ අනෙක් ජයග්‍රාහී ශිෂ්‍යාවෝ වූහ. විවාද සංගමය භාර පියමාලි ජයවර්ධන ගුරු මහත්මිය ඇතුළු එම සංගමයේ සියලු ගුරු මහත්ම මහත්මීහු ජයග්‍රහණය සඳහා ශිෂ්‍යාවන් මෙහෙයවූහ.

## අන්තර් පාසල් දැනුම මිනුම තරගාවලිය

ගම්පහ කලාපයේ අන්තර් පාසල් දැනුම මිනුම තරගාවලියේ දී අප පාසල් දැනුම මිනුම කණ්ඩායම දෙවන ස්ථානය දිනා ගත්හ. ශාන්ති ප්‍රියංගනී සහ නර්මදා දියාලගොඩ යන ගුරු මහත්මීන් යටතේ පුහුණුව ලැබූ කාවින්දි කේෂාණි (13 L), මදාරා දිව්‍යාංජලී (13 L), බිනු බිහාරා (12 A), සහ විශ්වා පමෝදි (12 K) යන ශිෂ්‍යාවෝ මෙම කණ්ඩායම නියෝජනය කළහ.

## අන්තර් පාසල් දැනුම මිනුම තරගාවලිය

බහුවිධ බුද්ධි සංකල්පයට අනුව සංවිධානය කරන ලද හොඳම ආහාර පිසින්නියන් තේරීමේ පාසල් මට්ටමේ තරගාවලිය 7 ශ්‍රේණිය සඳහා පසුගියදා පැවැත්විණි. ගෘහ විද්‍යා අංශය භාර නදීරා ගුණසේන ගුරුමහත්මිය ඇතුළු ගෘහ විද්‍යා විෂය භාර ගුරු මහත්මීන්ගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කෙරුණු මෙම තරගාවලිය කාගේත් පැසසුමට බඳුන් විය.

**කණ්ඩායම් තරගයේ ප්‍රතිඵල**

| | | |
|---|---|---|
| ප්‍රථම ස්ථානය | - | 7B (5 වන කණ්ඩායම) |
| දෙවන ස්ථානය | - | 7F (2 වන කණ්ඩායම) |
| තෙවන ස්ථානය | - | 7F (3 වන කණ්ඩායම) |

**කේවල තරගයේ ප්‍රතිඵල**

| | | |
|---|---|---|
| ප්‍රථම ස්ථානය | - | ජේ.ජේ. ඔනෙලි අයත්මා (7A) |
| දෙවන ස්ථානය | - | එච්.එම්. ඉමේෂා දේවින්දි (7F) |
| තෙවන ස්ථානිය | - | ජේ.ඒ.ඩී. ටෙහාරා දේවින්දි (7F) |

## අන්තර් පාසල් දැනුම මිනුම තරගාවලිය

පාසල් වෙස් සංගමය භාර ගයනි ෆ්‍රැන්සිස් ගුරු මහත්මිය ඇතුළු වෙස් සංගමයේ සියලු ගුරු මහත්ම මහත්මීන්ගේ අධීක්ෂණය යටතේ වෙස් සංගමය විසින් සංවිධානය කර පවත්වන ලද ශ්‍රේණි මට්ටමේ වෙස් තරගාවලිය පසුගියදා විද්‍යාලයේදී පැවැත්විණ. එහිදී ශිෂ්‍යාවෝ මෙසේ සිය ජයග්‍රහණ සනිටුහන් කළහ.

| | | | |
|---|---|---|---|
| 6 ශ්‍රේණිය | - ප්‍රථම ස්ථානය | - මිහිෂිකා සමරදිවාකර | - (6 E) |
| | දෙවන ස්ථානය | - පෘථිවි අටලුගම | - (6 C) |
| | තෙවන ස්ථානය | - වෙනුරි දිමන්ති අධිකාරි | - (6 E) |
| 7 ශ්‍රේණිය | - ප්‍රථම ස්ථානය | - අමෝධා ඕෂධී | - (7 F) |
| | දෙවන ස්ථානය | - ලිත්හාරා මෙතුලි | - (7 G) |
| | තෙවන ස්ථානය | - මධුනි චනාරා | - (7 F) |
| 8 ශ්‍රේණිය | - ප්‍රථම ස්ථානය | - තරුෂි දිසානායක | - (8 D) |
| | දෙවන ස්ථානය | - සනුගි විමංසා | - (8 E) |
| | තෙවන ස්ථානය | - තරුපමා අධිකාරි | - (8 C) |
| 9 ශ්‍රේණිය | - ප්‍රථම ස්ථානය | - ලුම්ණි අමායා | - (9 F) |
| | දෙවන ස්ථානය | - ඩී.ජී. දේශිකා | - (9 E) |
| | තෙවන ස්ථානය | - කවින්දි තිසාරා | - (9 A) |

14 පිටුවට

## කෙටි කථාව

# බලාපොරොත්තුවක්



සිතේ පිරී තිබුණේ මා හට මින් පෙර කිසි දිනක නොදැනුණු, බිය ජනක වූ සිතුවිල්ලකි. වෛද්‍යවරියක වූ මා ශල්‍යාගාරය වෙත පිය නගමින් සිටියේ නව ප්‍රතිකාර ක්‍රමයක් අත්හදා බැලීමටය. ඒ සඳහා ඉදිරිපත් වූයේ අන් කිසිවෙකු නොව මගේ හොඳම මිතුරියයි. එක කුසේ උපන් දරුවන් තරමටම ළඟ අප දෙදෙනාගේ හය වසරක මිතුදමේ අනාගතය පැවිතියේ මා අතය. මාත් සමගම ශල්‍යාගාරයට පියමනින වෛද්‍ය සහයක කණ්ඩායම අතර තරමක් බියමුසු වූ බවක් දක්නට ලැබුණි. නමුත් ගමන් කරන ගිලන් ඇඳක නැග මාගේ දෑතින් අල්ලාගෙන මා දෙස බලා සිටින ඇයගේ සිතිවිල්ල බොහෝ සෙයින් වෙනස් ය. ඇයගේ සිත සිය ප්‍රථම දරුවා මුල්වරට දෑතට ගත් මවකගේ මෙන් වේදනාව මුසු සතුටකින් පිරී තිබුණි. මාගේ සිතට මදක් හෝ සහනයක් ලබා දුන්නේ ඇයගේ අහිංසක වූ සිනහවයි. ඈ වෘත්තියෙන් දක්ෂ ගායිකාවක වූවාය.

මඳ වේලාවකින් අපි සියල්ලෝම ශල්‍යාගාරයට පිවිසුණෙමු. අවශ්‍ය උපකරණ ආදිය පිළියෙල කිරීමට වෛද්‍ය සහායක කණ්ඩායම පිටව ගිය නිසා මම හා මිතුරිය බොහෝ වේලාවකට හුදකලා වූවෙමු.

''ඔයා ඉන්නේ බයවෙලා නේද?'' ඇය මගෙන් ඇසුවාය.
''නෑ, නෑ, එහෙම දෙයක් නෑ'' මම පිළිතුරු දුන්නෙමි.
''අහන්න, මේ ලෝකෙ ඔයා ගැන මං තරම් වෙන කවුරුත් දන්නේ නෑ. මට ඔයාගෙ හිත කියවන එක මහ දෙයක් නෙවෙයි. මම නම් බය නෑ. මොකද මට ඔයාව විශ්වාසයි. මම කොහොම හරි ජීවත් වෙන්නම්. අපිට මේක කරන්න පුළුවන්.'' මට කීමට දෙයක් ඉතිරි නොවීය.

සුළු නිහැඬියාවකට පසු ඇය මාගේ ප්‍රියතම ගීතය ගායනා කළාය.

''සුමුදු මල්පෙති පරව යන විට - එපා කියා මල රකින්නද මම
සිනිඳු කොපුල් තෙමෙනකොට ඔබෙ - මමත් කඳුලක් තනන්නද මට
අදත් හෙටත් හැමදාමත් - දෑත අල්ලන් මිතුරි ලෙස ඔබෙ
පසුපසින් මම නිතර එන්නම් - සිනා රැළි කඳුළු ද බෙදන්නට''

එම වචන මගේ සිත පාරමින් කාවැදුණි. පෙර මෙන් අලංකාර නොවූ වේදනා බර ඇගේ හඬ මගේ සිතට නිදහසක් ගෙන දුන්නේය.

මා ඇය ගැන බොහෝ දේ දැන සිටියේ ඇය හමුවීමට පෙර සිටය. ඇය මා ගැන කොතරම් දැන සිටියත් මගේ අතීතය හරිහැටි දැන සිටියේ නැත. ඇය එය කිසි දින මගෙන් ඇසුවේ ද නැත. ඒ එය පැවසීමට මුල පිරීම පවා මට වේදනාවක් බව ඈ දත් නිසාය. මා කතාවට මුල පිරුවේ එහෙයිනි.

මාගේ ළමා කාලය දුක්කම්කටොලු රැසකට උරුමකම් කී කාලයකි. සියල්ල ආරම්භ වනවිට මගේ වයස අවුරුදු 8 කි. එකල මා ලද ශිෂ්‍යත්වයකින් නගරයේ ප්‍රසිද්ධ පාසලක ඉගෙන ගතිමි. වයසට වඩා දක්ෂතා පෙන්වූ මම පාසලේ සිටියේ අන් අයට වඩා ශ්‍රේණි 3ක් ඉහළිනි. කුඩා කල සිටම මා වෛද්‍ය විද්‍යාවට හා සංගීතයට දැක්වූයේ මහත් ඇල්මකි. එදා පාසල් වාරයේ අවසාන දිනය විය.

මා සිටියේ තෙමසටක පසු පවුලේ අය දැක ගැනීමේ බලවත් ආශාවෙනි. මා කුඩා කල මගේ පියාට සිදු වූ අනතුරකින් පාදයක් ඉවත් කිරීමට සිදු විය. ඔහුට මා කැටුව යාමට මෙහි පැමිණීම අසීරුය. පියා හා බාල සහෝදරයාගේ වැඩ කටයුතු නිසා මවටද පැමිණීම අසීරුය. එනිසා මම බසයකට ගොඩ වූයේ තනිවමය.

මා මගේ උපන් ගමට යන විට බොහෝ රෑ බෝ වී තිබුණි. මා බස් නැවතුමෙහි සිටියේ මව පැමිණෙන තුරුය. එදා මා වෙනුවෙන් බොහෝ වේලා යනතෙක් කිසිවෙකුත් ආවේ නැත. ඒ වන විටත් මගේ හද බියෙන් පෑරෙමින් තිබුණි. හැකිතාක් සිත ධෛර්ය කරගත් මම තනිවම නිවස බලා ඇවිද යාමට ගොස් ඇති සේය. මා හට කුමක් කරන්නේදැයි සිතා ගැනීමට පවා නොහැකි විය. මට හැඬීමට උවමනා වුවත් ඒ වෙනුවෙන් කඳුළු ඉදිරිපත් වූයේ නැත. මම බිරාන්තව ගල් ගැසී මෙන් බලා සිටියෙමි. නිවස තුළින් පැමිණියේ පොලිස් නිලධාරියෙකි.

''බබා මේ ගෙදරද?'' ඔහු ඇසීය.
මගේ කටින වචන පිටවූයේ නැත. මම හිස සැලුවෙමි.

ඉන්පසු මගේ ජීවිත කතාව ලියවුණේ ළමා නිවාසයකය. පවුලේ ඉතිරි වී සිටි එකම කෙනා මම වූවෙමි. මා භාරගැනීමට කිසිවෙකුත් ඉදිරිපත් වූයේ නැත. වේදනාව දරාගත නොහැකි වූ මම ශක්තියෙන් හීන වූවෙමි. දින කීපයක් යනතෙක් මම තනිවම කල්පනා කළෙමි. පෙරදින බලෙන් ළමා නිවාසයේ පාලිකාව මට කැවූ බත්කට ඇර කිසිවක් අනුභව කිරීමට තරම් සිත ශක්තිමත් වූයේ නැත. මට මතක එපමණි.

මා දෑස් අරිය විට සිටියේ කාමරයකය. එහි සුරංගාවන්ගේ රූප අලවා තිබුණි. මා සිටින ස්ථානය ගැන හරිහැටි දැනගත්තේ අතට සවිකර තිබුණු ''සේලයින්'' එකෙනි.

''ඔයා නැගිට්ටා ද?'' ගෑණු ළමයෙක් මගෙන් ඇසුවාය.

හිඳ ගැනීමට මා උත්සාහ කළත් නොහැකි විය.

''කමක් නෑ. හාන්සිවෙලා ඉන්න.''
''ඔයා කවුද? මම ඇසුවෙමි.''
''ඔයාගේ යාළුවා - මගේ නම ඇමැන්ඩා. හමුවීම සතුටක්.''

කලක් යන විට අපි මිතුරන් වීමු. නමුත් මා විසිවන වියේ පසුවන විට ඇය ද මෙලොවින් සමුගත්තේ යළිත් මා තනිකරමිනි. ඉන් පසු මා හට කිසිවෙකුත් වූයේ නැත.

රෝහලේ ලාබාලතම හා දක්ෂතම වෛද්‍යවරිය මා වුවත් කවුරුත් මා ආශ්‍රයට පැමිණියේ නැත. මා සිතුවේ ඔවුන් මා අනාථ දරුවෙකු නිසා නොසලකා හරින බවයි. එසේත් නැතිනම් මා බාල වයසේදීම වෛද්‍යවරියක වූ නිසාවෙන් විය හැක. සියල්ල වෙනස් වූයේ මොහොතකිනි. එවිට මා විසිදෙවන වියේ පසු වූවෙමි. රෝහලේ ප්‍රධානීතුමාගේ විශේෂ ඉල්ලීමක් හේතුවෙන් මම රෝගියෙකු වෙත පියනගමින් සිටියෙමි. ඔහු මට අණ දුන් ලෙස රෝගියාගේ සියලු දත්ත රහසිගත විය යුතුය. මා සිටියේ මඳ චකිතයෙනි.

මා බලාපොරොත්තු වූයේ අමුත්තෙකි. නමුත් මේ හුරුපුරුදු අමුත්තියකි.

''එක්ස්කියුස් මී.'' මම ඇතුළට ගියෙමි.
''මම ඩොක්ටර් අනන්‍යා. ලොකු සර් මට තමයි කිව්වේ ඔයාව බලන්න කියලා.''

මා ඇයව දුටුවේ එම මොහොතේදීය. ඒ අන් කිසිවෙකුත් නොවේ. හුදකලා වූ මගේ සිත සැනසූ ඖෂධය, මා ප්‍රිය කළ ගායිකාවයි.

''කොහොමද? දන්නවනෙ මම''
ඈ මට අතට අත දුනි. ඇගේ දෑත් සීතල වී ගොසිනි.

දීර්ඝ පරීක්ෂණ මාලාවකින් පසු හෙළි වූයේ ඇය කිසිදා ප්‍රතිකාරයක් තියා වැළැඳීමට හේතුව වත් සොයාගෙන නැති රෝගයකට ගොදුරු වී ඇති බවය. ඒ වන විටත් ඇයගේ ප්‍රතිශක්තීකරණ පද්ධතියට දැඩි සේ හානි වී තිබුණි. එදා එලෙස හමු වූ අපි දැන් හොඳම මිතුරියෝ වෙමු. මම දිනක් ජාතික වෛද්‍ය සභාවේ හමුවකදී මෙම රෝගයට හේතු කාරකය හා ප්‍රතිකාරයක් සොයාගත් බව දැන්වූවෙමි. ප්‍රතිකාරය ජීවිත අවදානම් සහිතය. මගේ සිතේ බිය හටගත්තේ එහෙයිනි. කිසිවෙකු නොසිතූ මොහොතක ඇය ස්තම්භයක් සේ ගාම්භීරව නැගී සිටියාය.

''මේක ගොඩක් බරපතල ප්‍රශ්නයක්. ජීවිතයත් මරණයත් අතර සටනක් මේ වෙන කොටත් දහස් ගණන් දෙනා මේ නිසා මැරිලා තියෙනවා. හරියට කන්න බොන්න බෑ. මහන්සියි. සති ගණන්, මාස ගණන්, අවුරුදු ගණන් බෙහෙත් ගන්න ඕනි. ගොඩක් වෙලාවට මට මේක වේදනාවක්. කමක් නැහැ. නමුත් මට දරාගන්න බැරි මගේ යාළුවා, මගේ ඉස්සරහ ඉන්න මේ දෙවඟන, මට වඩා විඳවනවා. රෑ තිස්සේ නැගිටලා එක්ස්පෙරිමන්ට්ස් කරනවා. දවසක් දෙකක් නොවේ. අවුරුදු ගාණක්. නමුත් අද අපි හැමෝටම අවස්ථාවක් හම්බෙලා තියෙනවා හොඳ වෙන්න. ඒ මගේ යාළුවාගේ මහන්සියේ ප්‍රතිඵල. තවත් එයා විඳවනවා. බලා ඉන්න බෑ. ඒ නිසා මම ඉදිරිපත් වෙනවා. මගෙන් මේ ක්‍රමය අත්හදා බලන්න.''

ඒ වදන් මගේ සිත පුරා විදුලියක් මෙන් පැතිරුණි. අප දෙදෙනාගේම දෑස්වල කඳුළු පිරී තිබුණි. එදායින් පසු මා ඈ දකින සෑම විටම ඇය දුටුවේ වීර කාන්තාවක ලෙසිනි.

''ඩොක්ටර් අනන්‍යා.'' මම හැරී බැලුවෙමි.
ඒ මාගේ වෛද්‍ය සහයක කණ්ඩායමයි.
''ඔපරේෂන් එකට වෙලාව හරි''

පැය අටකට ආසන්න සැත්කමකින් පසු ඈ සිටියේ සුපුරුදු රෝගී කාමරයකය. ඒ ජීවත්වීමේ අපේක්ෂාවක් බලාපොරොත්තුවෙනි. මගේ පසුපස බොහෝ දෙනා සිටියත් මට දැණුනේ හුදකලා බවකි. මිතුරියට සවිකර තිබුණු ජීවිතාරක්ෂක යන්ත්‍රයේ ශබ්දය හැරෙන්නට අන් කිසිදු ශබ්දයක් නොවීය.

මම ජනේලයෙන් පිටතට දෑස් යොමු කොට අනන්තය දෙස බලා සිටියෙමි. ශීත ඍතුවේදී අතු පමණක් ඉතිරිව තිබූ විශාල වෘක්ෂයන් යළිත් දළු ලා වැඩෙන්නට පටන් ගෙන තිබිණ.

නිමි.

**කර්ස්ටින් අනන්‍යා චන්ද්‍රරත්න**
**10 - එෆ්**



# මගෙ දුවේ නුඹ අවදියෙන්නම්,

## ආදර දියණියනි,

බොහෝම ඉස්සර දවසක රෝස පාට බෝනික්කෙක් වගේ දුව මොලොවට උපන් දවස මගෙයි තාත්තගෙයි ජීවිතේ සතුට උතුරපු දවසක් වුණා. එදා ඉඳලා අපි ඇඟිලි ගැන්නේ දුව ටිකෙන් ටික ලොකු වෙනකම්. හය හතර නොතේරෙන කාලේ ඉඳලා අපි දුවගේ හපන්කම් දැකලා සතුටු වුණා. දුව යන්තම් බහ තෝරණ වියේදී කිව්ව චූටි චූටි සිංදු, මුල මැද අග පටලවලා කිව්ව කතන්දර අදටත් කියලා අපි හිනා වෙනවා.

දුවෙක් ඉන්න අම්මා කෙනෙක් වුණාම ලොකු වගකීමක් හිතට එනවා. මගේ දුව දැන් පොඩි ළමයෙක් නෙමෙයි. කියන හැඟීම ආවම ඒ වගකීම තවත් දැඩිව දැනෙනවා. ඉස්සර වගේ නෙමෙයි දුවේ. දැන් සමාජේ වෙනස්. ඉස්සර දැකපු ළමා විය, තරුණ විය, ඒ කෙළි දෙළෙන් ගත කළ පාසල් විය අද වෙනස් වෙලා. මගේ දුවට තේරෙනවාද? අම්මා නිතරම කියනවා ඉස්සර අපි පාසල් විය ගත කළ අපූරුව. දුව ඒවා අහන්නේ සුරංගනා කතා අහන විදිහට. උදේ ඉඳලා දවසේ වැඩි කාලයක් තරුණ ළමයින් නෙත ගැටෙන අම්මා කෙනෙක් විදිහට මම දකිනවා එදාට වඩා සමාජය කොතරම් පිම්මක් ඉස්සරහට ගිහින්ද කියලා. මගේ දුව හිතයි ඒ, දියුණුවේ පිම්මක් කියලා. කියන්නත් කනගාටුයි, සමහර තරුණ දරුවෝ හැසිරෙන විදිහ දැක්කම, අම්මා කෙනෙක් විදිහට දුක හිතෙනවා. ඒත් මට ආඩම්බරයි, මගේ දුව එහෙම නැති එක ගැන. දුව තාම ප්‍රාථමික පන්තිවල උගන්නපු ගුරුවරයෙක් දකිද්දි දණ ගහල වඳිනවා. ඒක හරි උතුම් ක්‍රියාවක් දුවේ. තමන්ට උගන්නපු ගුරුවරයෙකුට, වැඩිහිටියෙකුට කතා කරන, සලකන විදිහ අපි ඉගෙන ගන්න ඕන.

''මැටි කළය බිඳුණොත් - නැත එහි අගය මඳකුත්
අකීකරු දරුවොත් - එසේමය එපමණ ද නොවටිත්''

අපි අනාදිමත් කාලයක ඉඳලා හොඳ ශිෂ්ට සම්පන්න සමාජ සංස්කෘතියකට උරුමකම් කිව්ව ජාතියක්. වර්තමානය වන විට ඒ සංස්කෘතිය කොහේද කියලා පේන තෙක් මානයක නෑ. බටහිර රටවලින් එන විවිධාකාර විලාසිතාවලට තරුණ දූවරු ගොදුරු වෙලා. ඉස්සර අපේ අම්මලා කිව්වෙ ගැහැණු ළමයෙක් ලැජ්ජ බයට හැදෙන්න ඕන කියලා. ඒක කොයිතරම් සාම්ප්‍රදායික කියමනක් වුණත් ඒකේ ඇත්තක් තියෙනවායි කියලා මට හිතෙනවා පුතේ. බලන්න අද අමතර පන්ති යන තරුණ දරුවෝ අඳින ඇඳුම්, කතා කරන විදිහ, හැසිරෙන විදිහ, හිතාගන්නවත් බෑ. හරිම කනගාටුයි. මගේ දුවටත් මේවා නිතර දකිද්දි, ඇහෙද්දි ඔයාගේ තරුණ හිත මේවාට ඇදිලා යන්න පුළුවන්. ඒත් ඒවායේ නිසරු බව දුව වටහාගෙන ඉන්න බව මට හොඳටම සහතිකයි. මොකද මගේ දුව ඒ තරමටම සරලයි, චාම්. ඒ නිසා මේ අම්මා ඒ ගැන හිතලා ගොඩක් සතුටු වෙනවා.

තවත් විලාසිතාවක් තමයි දුවේ, ප්‍රේම සම්බන්ධතා. එහෙම නැති කෙනෙක් දිහා බලන්නෙත් අමුතු විදිහට. හරි පුදුමයි. ඉගෙන ගන්න තියෙන කාලේ මේ දේවල් කළාම තරුණ කාලේ දී කරන්න දෙයක් ඉතිරි වෙන්නේ නෑ. ඒ වගේම තමයි අද කාලේ ආදරේ කරනවා කියලා තරුණ ගැහැනු දරුවෝ අනන්තවත් කරදරවල පැටලෙනවා. දුවට තේරෙන කාලේ ඉඳලා මම කියලා දුන්න දේවල් නිසා දුව මේ දේවල් ගැන මාත් එක්ක කියනවා. ඒක ගොඩක් හොඳ පුරුද්දක්. ගෑනු දරුවෙක් වුණාම තමන්ගේ අම්මාට ඕන දෙයක් කියන්න පුළුවන් වෙන්න ඕන. දුව හැමදාම පාසලේ දේවල්, පන්තිවල දේවල් මා එක්ක කියනවා. ඒවායින් ඔයා කොච්චර සමාජය තේරුම් අරගෙන තියනව ද කියලා මට තෙරෙනවා. මමත් තාත්තාත් ඒ ගැන ගොඩක් සතුටු වෙනවා මගේ පුතේ. මොකද, සමාජය කොච්චර නපුරු වුණත්, වැරදි වුණත් අපේ දුව එහෙම නෑ කියලා අපි දන්නවා.

දුවේ නුඹ මගේ ප්‍රාණයයි
සැබෑ වුණ සුබ සිහිනයයි......

මේ ගීතයට මම ගොඩක් ආස කරනවා. කවදා හරි අපේ දෝණිත් සනුහරේ අභිමානය රකීවී කියලා ලොකු විශ්වාසයක් මට තියෙනවා. හැම අම්මා කෙනෙක්ම තමන්ගේ දුව ගැන මහා ඉහළින් සිහින දකිනවා. තමන්ට වඩා ඉහළ තැනකට තමන්ගේ දෝණිව ගෙනියන්න දුක් විඳිනවා, උනන්දු කරනවා, බනිනවා. ඒ හිතේ කිසිම තරහකින් නෙවෙයි. මගේ දුවේ, කවදා හරි ඔයා නැණ, ගුණ පිරි දරුවෙක් වෙලා රටට සමාජයට උදාර මෙහෙයක් කරාවි කියලා අපේ හිතේ බලාපොරොත්තු තියෙනවා. මම දන්නවා, මට දැනෙනවා, මගේ ඒ බලාපොරොත්තු දෝණි ඉෂ්ඨ කරාවි කියලා, දුව නංගිලටත් ලොකු ආදර්ශයක් වේවි කියලා. අනාගතේ දැකලා සතුටු වෙන්න පුළුවන් ජීවිතයක් දුව ගත කරාවි කියලා විශ්වාසයක් තියෙනවා.

ජීවිතයට සතුට රැගෙන
පැමිණි මගේ සුදු දුවේ
ජීවිතයම ගීතයක්ව
ගයනු ඇතැයි මට සිතේ
ආ මගටත් වඩා තවත්
යා යුතු මඟ තව තිබේ
නොනැවතීම පෙරට යන්න
ජයටැඹ ඇත ඒ මගේ.

අදාරණීය දුවේ, ඔයා ජීවිතයේ තීරණාත්මක කඩඉමකට මේ වසරේදි මුහුණ දෙනවා. ඒ සඳහා සූදානම් වන්න අවශ්‍ය කාලය තියෙනවා. පාසල් වියේ ලබන ඉහළම ජයග්‍රහණය ලබා අම්මාගේත්, තාත්තාගේ පාසලේත් කීර්තිය ආරක්ෂා කරන්න මගේ දුවට පුළුවන්.

තත්පරෙන් තත්පරේට කප්පරක් කාලය ගත වෙනවා. උස් මහත් වෙච්ච දුවෙක් ඉන්න හැම අම්මෙකුටම තාත්තා කෙනෙකුටම ලොකු බලාපොරොත්තුවක් තියෙනවා ඒ තමන්ගේ දුව සමාජයේ ඉහළ තැනක ඉන්නවා දකින එක.

දැන ඉගෙන ගත්තම - තමයි කෙනෙකුගේ වත්කම
නැණ නුවණ දැක්කම - ඔබට සලකයි රටේ ඕක්කොම

මගේ සුදු දුවත් කවදා හරි ලස්සනට ජීවත් වෙනවා දකින්න අම්මත් තාත්තාත් දෑස් දල්වා බලා ඉන්නවා. ඒක තමයි අම්මා කෙනෙක් විදියට ලබන ඉහළම සතුට. මගේ සුදු දෝණිට බුදු සරණයි.

**මේ ඔබේ ආදරණීය අම්මා,**
**කේ.ඒ. චන්ද්‍රකාන්ති**
**(ගුරු වෘත්තිය)**

**බාධාවක් යනු වෙස්වලාගෙන ආ පාඩමකි.**

# යසෝ පුවත්

## ළමා හා වැඩිහිටි දිනයට සමගාමී ශ්‍රමදානය හා දානමය පිංකම

ඔක්තෝබර් මස 01 වන දිනට යෙදෙන ළමා හා වැඩිහිටි දිනයට සමගාමීව විද්‍යාලයීය ශාන්ත ජෝන් ගිලන්රථ සේවය මගින් සංවිධානය කරන ලද ශ්‍රමදානය හා දානමය පිංකම වතුපිටිවල හිල්ඩා ඔබේසේකර ළමා සහ වැඩිහිටි නිවාසයේදී 2019 සැප්තැම්බර් 28 වන දින පැවැත්විණ.

## චිත්‍ර සහ ඡායාරූප ප්‍රදර්ශනය

2019 වාර්ෂික චිත්‍ර සහ ඡායාරූප ප්‍රදර්ශනය 2019.10.17 සහ 18 දිනයන්හිදී විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේදී පැවැත්විණ. ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් එවකට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ අනුර ප්‍රේමලාල් මහතාද, විශේෂ ආරාධිත අමුත්තා වශයෙන් ප්‍රවීණ චිත්‍ර ශිල්පී ආර්.කේ.ඕ. රණසිංහ මහතාද සහභාගී වූ මෙම උලෙළ සඳහා එල්.බී.එස්.එස්. බාලසූරිය, ගාමිණී ආර්. ෆොන්සේකා සහ සේනාරත්න බණ්ඩාර යන ඡායාරූප ශිල්පීහුද සහභාගී වූහ. චිත්‍ර සහ ඡායාරූප ප්‍රදර්ශනය සියලු දෙනාගේ නොමඳ පැසසුමට බඳුන් විය.

## "යසෝ මල් යාය"

යසෝදරා දේවි බාලිකා විද්‍යාලයීය ඉතිහාසයේ ප්‍රථම වතාවට සංවිධානය වූ ''යසෝ මල් යාය'' ප්‍රාථමික අංශයේ විවිධ ප්‍රසංගය 2019-11-22 දින විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේදී අති උත්කර්ෂවත් අන්දමින් පැවැත්විණ. බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ (ප්‍රාථමික) දුෂ්මන්ත සී. රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් හා ගම්පහ අධ්‍යාපන කලාපයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (ප්‍රාථමික) චන්දි විජේසිංහ මහත්මියගේ විශේෂ සහභාගීත්වයෙන් පැවැත්වුණු මෙම උලෙළ ප්‍රාථමික අංශයේ සිසුවියන්ගේ ගායන වාදන නර්තන අංගයන්ගෙන් වර්ණවත් විය.

## බිනර මස පොහොය වැටසටහන

බිනර මසට නියමිත පෙර පොහොය වැඩසටහන විද්‍යාලයේ 6 ශ්‍රේණියේ සිසුවියන් හා පංති භාර ගුරු මහත්මීන්ගේ සහභාගීත්වයෙන් 2019.09.12 වන දින විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේදී උදෑසන 9.30 සිට 10.30 දක්වා පවත්වන ලදී. හලාවත දම් නිරෝධා මෙහෙණින් වහන්සේගේ සුමධුර ධර්ම දේශනයක් එම වැඩසටහනට ඇතුළත් විය.

## බිනර මස පොහොය වැටසටහන - ප්‍රාථමික අංශය

ප්‍රාථමික අංශයේ පෙර පොහොය වැඩසටහන 2019.09.12 වන දින පෙ.ව. 8.00 සිට 9.00 දක්වා විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේදී පැවැත්විණ. මිනුවන්ගොඩ නාලන්දා පිරිමි විද්‍යාලයේ නි. විදුහල්පති වැහැර සුදම්ම හිමිගේ සුමධුර ධර්ම දේශනයක් වැඩසටහනට ඇතුළත් විය.

## වාණිජ දිනය

''මුදල් විශුද්ධිකරණය'' තේමා කොටගනිමින්. ESPERTO BLAZE' 19 නමින් මෙවර වාණිජ දිනය 2019/11/05 වන දින විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේදී අති උත්කර්ෂවත් ලෙස පැවැත්විණ. J.M.C. ආයතනයේ අධිපති J.M.U.B. ජයසේකර මහතා ද ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ මූල්‍යාධිකාරිනී K.T.C. ප්‍රියංගනී මහත්මිය ද මෙදින ප්‍රධාන ආරාධිත අමුත්තන් ලෙස සහභාගී වූහ.

## සෞඛ්‍ය කඳවුර

7 ශ්‍රේණියේ ශිෂ්‍යාවන් වෙනුවෙන් එන්නත් ලබා දීමේ සෞඛ්‍ය කඳවුර 2019.10.29 වන දින විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේදී පැවැත්විණ. ගම්පහ මහ රෝහලේ වෛද්‍ය නිලධාරි මඬුල්ලකගේ සහ ගම්පහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි මඬුල්ලකගේ සහභාගීත්වයෙන් ක්‍රියාත්මක කෙරුණු මෙම කඳවුර සඳහා ශාන්ත ජෝන් ගිලන් රථ සේවයේ නොමඳ සහයෝගය හිමි විය.

## ප්‍රාථමික අංශයේ ළමා දින සැමරුම

ප්‍රාථමික අංශයේ ළමා දින සැමරුම 2019.10.03 දින විද්‍යාල පරිශ්‍රයේදී පැවැත්විණ.

## ගුරු උපහාර උලෙළ

ශිෂ්‍ය නායිකා සංසදය මගින් සංවිධානය කරන ලද 2019 වර්ෂයේ විශ්‍රාම ලැබූ සහ ස්ථාන මාරු ලැබූ ගුරු භවතුන් උදෙසා වන ගුරු උපහාර උපහාර උලෙළ පසුගිය දා ප්‍රධාන ශාලාවේදී පැවැත්විණ.

## ළමා දින සැමරුම

ලෝක ළමා දින උලෙළට සමගාමීව පවත්වනු ලබන විද්‍යාලයීය ළමා දින සැමරුම 2019.10.01 දින විද්‍යාලයීය භූමියේදී පැවැත්විණ. සිසුවියන්ගේ ගායන, වාදන, නර්තන අංශයන්ගෙන් උලෙළ විචිත්‍රවත් විය.

## කලා උලෙළ "සරසාභිනන්දනී - 2019"

''සරසාභිනන්දනී - 2019'' කලා උලෙළ 2019.10.23 වන දින ප්‍රවීණ නාට්‍යවේදී ජ්‍යෙෂ්ඨ රංගධර ශ්‍රියන්ත මෙන්ඩිස් මහතාගේ ප්‍රධානත්වයෙන් ද ගම්පහ අධ්‍යාපන කලාපයේ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ (සිංහල) ප්‍රජා රත්නායක මහත්මියගේ විශේෂ සහභාගීත්වයෙන් ද විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේදී අති උත්කර්ෂවත් අන්දමින් පැවැත්විණ.

## ශිෂ්‍ය නායිකා නිල ලාංඡන පැලඳවීම

විද්‍යාලයීය ආදි ශිෂ්‍යාවක වන නීතිය පිළිබඳ ආචාර්ය කොළඹ විශ්ව විද්‍යාලයේ නීති පීඨයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තක්ෂිලා උදයංගනී මහත්මියගේ ප්‍රධානත්වයෙන් පසුගියදා ශිෂ්‍ය නායිකා නිල ලාංඡන පැලඳවීමේ උත්සවය පාසල් පරිශ්‍රයේදී පැවැත්විණ.

## ලෝක ගුරු දින සැමරුම

විද්‍යාලයීය ශිෂ්‍ය නායිකා මණ්ඩලයේ සංවිධානයෙන් ද, ආදි ශිෂ්‍ය සංගමයේ දායකත්වයෙන්ද 2019.10.07 වන දින ලෝක ගුරු දින සැමරුම පැවැත්විණ.

## වාර්ෂික පිරිත් සජ්ඣායනය හා අනගාරික ධර්මපාල දානය

අනගාරික ධර්මපාල ශ්‍රීමතාණන්ගේ අනුස්මරණ පිංකම් මාලාවට සමගාමීව විද්‍යාලයීය වාර්ෂික පිරිත් සජ්ඣායනය හා උදෑසන හීල් දානමය පුණ්‍යකර්මය මෙවර 2019.09.20 දිනට සහ 2019.09.21 දිනට යෙදී තිබිණ. 20 වන දින රාත්‍රී සර්ව රාත්‍රික පිරිත් දේශනය පැවැත්වුණු අතර 21 වන දින උදෑසන සංඝයා වහන්සේලා 15 නමක් විෂයෙහි හීල් දානය පිරිනැමීමෙන් අනතුරුව වැඩසටහන නිමා විය.

මැදගම සිරි සුනන්දාරාමාධිපති පූජ්‍ය තුම්මෝදර සමිතසෝම හිමියන්ගේද ඉඳිගොල්ල විද්‍යාවංශ පිරිවෙන් නියෝජ්‍ය පරිවේනාධිපති ප්‍රසිද්ධ ධර්ම දේශක ශාස්ත්‍රපති පූජ්‍යපාද කිණිගම සෝම හිමියන්ගේද මූලිකත්වයෙන් හා අනුශාසකත්වයෙන් වැඩම කරන්නට යෙදුණ ස්වාමීන්වහන්සේලා මෙම කටයුත්ත සඳහා සහභාගී වූහ. විද්‍යාලයීය ආචාරිනී ගරු රත්නපුරේ දයාකුසුම් මෙහෙණින් වහන්සේගේ අනුශාසකත්වයෙන් සහ ගරු විදුහල්පතිතුමියගේ සහභාගීත්වයෙන් ද දෙමාපියන් හා සිසු දියණියන්ගේ පූර්ණ සහයෝගයෙන් ද මෙම පුණ්‍ය කටයුත්ත සාර්ථකව සිදු කරන ලදී.

## ප්‍රාථමික අංශයේ පරිසර ප්‍රදර්ශනය

2019.10.18 වන දින පරිසර ළමා සමාජයේ පළමු කණ්ඩායමේ සාමාජිකාවන් විසින් පරිසරයෙන් සපයාගත් අමුද්‍රව්‍ය ආශ්‍රයෙන් කරන ලද නිර්මාණයන් ඇතුළත් ප්‍රදර්ශනයක් පවත්වන ලදී.

## සති පාසල වැඩසටහන

පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන අංශය භාර ඩබ්.එම්.ආර්.පී. රණසිංහ ගුරු මෑණියන් විසින් සංවිධානය කරන ලද 5 ශ්‍රේණියේ සිසුවියන් සඳහා වූ සති පාසල වැඩසටහන 2019.10.28 වන දින විද්‍යාලයීය ප්‍රධාන ශාලාවේදී පැවැත්වුණු අතර, බස්නාහිර පළාත් අධ්‍යාපන උපදේශක ඒකකය භාර කේ.කේ.එල්. සමීර මහතා සම්පත් දායක උපදේශකවරයා ලෙස වැඩසටහනට සහභාගී විය.

යශෝරාවය
ත්‍රෛයි මාසික පුවත්පත

# පේලේ





දෙවන ලෝක යුද්ධය නිසා වර්ෂ 1942 දී සහ වර්ෂ 1946 දී ලෝක පාපන්දු ශූරතා තරගාවලිය පැවැත්වෙන්නේ නැහැ. එම නිසා 1950 දී පැවැත්වුණ පාපන්දු ලෝක ශූරතාව ක්‍රීඩා ලෝලීන්ට අතිශයින්ම වැදගත් වුණා. කාගේත් අවධානය දිනාගත්ත 1950 ලෝක පාපන්දු ශූරතා අවසාන තරගය උරුගුවේ සහ බ්‍රසීලය අතර පැවැත්වුණා. ලෝක පාපන්දු ශූරතාවේ අවසාන තරගයකට බ්‍රසීලය පැමිණි ප්‍රථම අවස්ථාව එය නිසා බ්‍රසීලයේම ඇස් ඒ මහා තරගය වෙතට යොමුවෙනවා. හරියට 1996 දී අපේ ක්‍රිකට් ලෝක කුසලානෙ වගේ. සැබැවින්ම ලෝක කුසලාන අවසන් තරගයක් යනු කණ්ඩායමක සිහිනයක් නොව ජාතික සිහිනයක්. බ්‍රසීල ජාතිකයන්ගේ ලේවල ම දුවන පාපන්දු ක්‍රීඩාවේ ජයග්‍රාහී සංධිස්ථානයක් වශයෙන් 1950 ලෝක කුසලානය හඳුන්වන්න පුළුවන්. එහෙත් එම තරගයේදී ඉතා අවාසනාවන්ත ලෙස බ්‍රසීලය පරාජයට පත්වෙනවා. සමස්ත බ්‍රසීලයම සති කිහිපයක්ම යනතුරු විශාදයට පත්වුණා කිව්වොත් වැරදි නැහැ. පරාජය නිසා විශාදයට පත්වුණ මිනිස්සු අතර වයස අවුරුදු නවයක කාගේවත් අවධානයට ලක් නොවුණ වැරහැලි ඇඳගත්ත කොළු ගැටයෙක් මුඩුක්කුවක හිටියා. බ්‍රසීල කණ්ඩායම ''ජින්ගා'' නම් ක්‍රමයට ක්‍රීඩා කිරීම 1950 තරගය පරදින්න ප්‍රධාන හේතුව කියලා කතාවෙනවා ඔහුට ඇහුණා. ''ජින්ගා'' යනු පාපන්දු ක්‍රීඩාවේ පිළිගත් තාක්ෂණික ක්‍රීඩා ශෛලියෙන් බැහැරව නිදහස්ව සෙල්ලම් කිරීමේ ක්‍රමයක්. එය බ්‍රසීල ජාතිකයන්ට සංස්කෘතියෙන් උරුම වුණ නිදහස් මෙන්ම ආක්‍රමණශීලී ක්‍රීඩා විලාසයක්. මේ පරාජයෙන් පස්සේ බ්‍රසීල ක්‍රීඩකයන් යුරෝපීය ක්‍රමයට නිවැරදි තාක්ෂණික ක්‍රමවේද ඔස්සේ ලස්සනට සෙල්ලම් කරන්න ඕනෑ කියන මතය ඔන්න හැදෙනවා.

''පිරිමි කවදාවත් අඬන්නැහැ කියලා මගේ දුප්පත් තාත්තා නිතරම කිව්වා. ඇත්තටම මම ඔහු අඬනවා දැකලම නැහැ. ඒත් එදා බ්‍රසීලය මැච් එක පැරදුණාට පස්සේ තාත්තා හයියෙන් අඬනවා මම දැක්කා. මම පුදුම වුණා. එතකොට මට වයස අවුරුදු නවයක් විතර ඇති. මම තාත්තට කිව්වා කවදහරි මම බ්‍රසීලයට ලෝක කුසලානයක් ගේනවා කියලා. එයින් හරියටම අවුරුදු අටකට පස්සේ එනම් 1958 දී බ්‍රසීලය හා ස්වීඩනය අතර පැවති ලෝක කුසලාන තරගයේ ක්‍රීඩකයෙක් ලෙස මට සහභාගී වෙන්න අවස්ථාව ලැබෙනවා. මට එතකොට වයස 17යි. ලොව ළාබාලතම පාපන්දු ක්‍රීඩකයා. අපි කප් එක ගන්නවා. බ්‍රසීලය ප්‍රථම වතාවට ලෝකශූරයින් වෙනවා.'' මෙහෙම අතීතය මතක් කරන්නේ පේලේ. පේලේ කියන නම ඔබට අමුතුවෙන් මතක් කරන්න අවශ්‍ය නැහැ. පාපන්දු මතක් කරන විට පේලේ මතක් විය යුතුමයි.

පේලේ, කවදාත් අඬපු නැති තාත්තා අඬපු දවසේ ඇතිවුණ සිත් වේදනාවට ලොකු පෙරොන්දුවක් දෙනවිට ඔහු කවුරුත් හඳුනාගත් දක්ෂ ක්‍රීඩකයෙක් නම් නෙවෙයි. ඔහු නිකම්ම නිකං මුඩුක්කුව පුරා අනිත් සගයන් සමඟ සෙල්ලම් කරකර හිටිය කුඩා දරුවෙක්. පාපන්දුවක් ගන්න සල්ලි නැති නිසා රෙදිවලින් හදපු පාපන්දුවකින් මුඩුක්කුව පුරා සෙල්ලම් කරන නිසා එය හිස් පිට්ටනියක ක්‍රීඩා කරනවාට වඩා අභියෝගාත්මකයි.

එඩිසන් අනේටිස් දෝ නාසි මෙන්ටෝ (Edson Arantes do Nascimento ) කවදාවත් පේලේ කියන නමින් ලෝක පූජිත වෙයි කියලා කවුරුත් හිතුවෙ නැහැ.'' මට පෙලේ කියන නම ලැබුණේ අහම්බයෙන්. මගේ නම එඩිසන්. දවසක් වීදියේ සෙල්ලම් කරද්දි කෙනෙක් මට විහිළුවට පේලේ කිව්වා. මම දන්නෑ ඇයි කියලා. අන්තිමට යාලුවො මාව අවුස්සන්න පේලේ කියන්න පටන්ගත්තා ඇත්තටම ඒ වැරදිලා ලැබුණ නම ඉතා වටිනවා කියලා මට අද හිතෙනවා.'' ඔහු නම වැටුණ ආකාරය ගැන එහෙම කියනවා.

හැබවින්ම එඩිසන් එහෙම නැත්නම් පේලේ ගෙවත්තේ තිබෙන අඹ ගස්වල එල්ලිලා තියෙන අඹගෙඩිවලට අංශක 360කින් කැරකිලා පාදයෙන් පහර දෙන්නට පියා සමඟ පුරුදු වෙනවා. ඔහුගේ ඇඟේ තියන ''ජින්ගා'' විලාසයට දිගටම සෙල්ලම් කරනවා. ''ජින්ගා'' ක්‍රමය තමයි අපේ ලේවල දුවන ක්‍රීඩා විලාසය.'' ඔවුන් දැඩිවම එය විශ්වාස කරනවා.

දුප්පත්කමෙහි අන්ත පතුලෙහි සිටින දරුවෙකු වන පේලේට ඔහුගේ මව නිසි අධ්‍යාපනයක් ලබාදීමට දැඩිව මහන්සි වෙනවා. මවගේ සිත රිදවිය නොහැකි නිසා ඔහු පියා සමඟ රහසින් පුහුණුවීම් කරනවා. සන්ටෝස් ක්‍රීඩා සමාජය විසින් ඔහුගේ අති දක්ෂ ක්‍රීඩා විලාශය දැක ඔහුව එම ක්‍රීඩා සමාජයට බඳවාගෙන වෘත්තීය ක්‍රීඩකයෙකු ලෙස පේලේ හට නිසි පුහුණුව හා අධ්‍යාපනය ලබාදීම ඔහුගේ ජීවිතයේ හැරවුම් ලක්ෂය වෙනවා.

බ්‍රසීල සුම්බා නර්තන රිද්මය වැනි නිදහස් ජින්ගා ක්‍රීඩා විලාසය ඇත්තටම ගරිල්ලා ක්‍රීඩා රිද්මයක්. ප්‍රතිවාදියාට පේලේ පාපන්දුව සමඟ සෙල්ලම් කරන අකාරය හිතාගන්නවත් බැහැ. එය මායාකාරියි. අද්විතීයයි. එහෙත් ක්‍රීඩා මූලධර්මවලට අනුකූලව තාක්ෂණික ක්‍රමවේදයකට සෙල්ලම් නොකර නිදහස් ජින්ගා ක්‍රමයට සෙල්ලම් කරන නිසා ඔහුව ක්‍රීඩා සමාජයේදී දැඩිව ප්‍රතික්ෂේප කරනවා. ඔහු යුරෝපීය ක්‍රමයට ක්‍රීඩා කරන්න බොහෝ උත්සාහ කළත්, ඔහුට එය කළ නොහැකි නිසා ඔහු පාපන්දු ක්‍රීඩාව අත්හැරලා යළි ගමට යන්න හිතනවා. බොහෝ වෙලාවට අපේ ක්‍රමය අනිත් අය ප්‍රතික්ෂේප කළාම අපිම අපව ප්‍රතික්ෂේප කරගන්නවා. පේලේත් එහෙම දෙයක් තමයි ඒ කුඩා වයසේදී කළේ.

''මට අනිත් අය වගේ සෙල්ලම් කරන්න බැහැ. තවදුරටත් මට බැරි දේ කරන්න ගිහින් අසාර්ථක වෙනවාට වඩා මම ගමට ගිහින් ඉගෙනගත්තොත් අඩුම ගානෙ මට රස්සාවක් හරි හොයාගන්න පුළුවන්. එහෙම නැත්තම් මටත් වෙන්නේ අම්මයි තාත්තයි කරනවා වගේ අනුන්ගේ වැසිකිලි පිරිසිදු කරන්න.'' පේලේ ඔහුගේ පරිණත පුහුණුකරුට එහෙම කියනවා.'' ඔහුව දිරිමත් කරනවා. පසුව ප්‍රතික්ෂේප කිරීම් රැසක් අතරතුර පේලේ ඔහුට පුරුදු විලාසයෙන් උපරිමයෙන් සෙල්ලම් කරන්න පුහුණු වෙනවා. සැබැවින්ම කිසියම් ක්ෂේත්‍රයක විශිෂ්ටයෙකු වන්නට ඕනෑ නම් ඔබට කළ හැකි දේ පමණක් කරලා වැඩක් නැහැ. ඔබ කළ යුත්තේ ඔබට ආවේණික රිද්මයෙන් තව තවත් හොඳින් කරන්න පුහුණු වෙන්න. ඔබ කරන්න හදන සුවිශේෂී දෙය කරලා පෙන්වන්න. එවිට ඔවුන් ඔබව අනුගමනය කරාවි.

ඔහු ජාතික කණ්ඩායමට ඇතුළු වන විට යාන්තම් වයස අවුරුදු දහසයයි. ඔහු ලෝක කුසලානයක් දිනනවිට වයස දාහතයි. 1958 දී බ්‍රසීල කණ්ඩායම ඉගෙනගත්ත හැමදේම අමතක කරලා ඔවුන්ගේ ශරීරය ප්‍රිය කරන ජින්ගා ක්‍රමයට සෙල්ලම් කරලා තරගය ජයග්‍රහණය කරනවා. පේලේ 1958, 1962 යන ලෝක කුසලාන ත්‍රිත්වය බ්‍රසීලයට ගෙන එන්න මහා දායකත්වයක් දක්වනවා එසේම එකදිගට ලෝක කුසලාන තුනක් දිනාගන්න දායකත්වය දක්වා ඇති එකම ක්‍රීඩකයා වන්නේද පේලේ. 1961 දී බ්‍රසීල ජනපති, පේලේ බ්‍රසීලයේ ජාතික වස්තුවක් ලෙස නම් කරනවා. අදටත් ලෝක කුසලානයක් ජයග්‍රහණය කරන්න දායක වුණ ළාබාලතම ක්‍රීඩකයා වන්නේ පේලේ. අන්තර්ජාතික ඔලිම්පික් කමිටුව පේලේ, යුගයේ ක්‍රීඩාකයා වශයෙන් නම් කරනවා. අපි, යුගයේ ක්‍රීඩකයා කියන මේ අපූරු කතාවට ටිකක් සවන් දෙමු.

''සාර්ථකත්වය අහම්බයක් නොවෙයි. ඒ සඳහා ගොඩක් වැඩ කරන්න ඕන. ජීවිතයේ සමහර දේවල් කැපකරන්නත් ඕන. ඒ වගේම තමා කරන දේ ගැන ඉගනීම සහ අධ්‍යයනය ඉතාම වැදගත්. මේ හැමදේටම වඩා වැදගත් වෙන්නේ තමන් කරන දෙයට ආදරය කිරීම හෝ එයට ආදරය කරන්න ඉගෙනීමයි.''

09 පිටුවට

**කල්පනා විජයලත් 13 - K**

# සිත් රූ


එන්.ටී. මෙත්වරි යෙනුලි සඳින්කා - 11 - G


දෙව්මි තිසරණී - 9 - B


මෙත්මි දහම්යා - 7 - A


නෙතුලි සත්මිතා පතිරණ - 7 - G


මලින්සා අස්විනි - 7 - E


ආර්.පී. සමිඳි තරුමිණී විජේසිංහ - 7-G


ඩී.එම්. නතාරි සඳුපමා අස්ගිරියගේ - 6-C


සන්තුෂ්ටි සිදාංගා 7 - B


ඒ.එච්. රනුෂි පබසරා - 7 - A


ඉඳුවරි ඉසිරි උත්කර්ෂා - 8 - G


සිනලි රිසාරා - 7 - A


එස්.ඒ.ඩී. දෙසඳි නෙත්නදි දිසානායක
7 - A


ඩබ්.ඒ.එල්. සචිනි විජේසිංහ
7 - C


ඩී.එම්. නතාරි සඳුපමා
7 - B


ඩබ්.පී.එස්. කවීෂා නෙත්මි
7 - G

උස් ස්වරත්, පහත් ස්වරත් කැටි වූ තැන මියුරු සංගීතය උපදී. කඳු පඳුරු, තැනිතලා, මීදුම කැටි වූ තැන මියුරු ජීවිත උපදී.

07 පිටුවෙන්




























# සිතුවිල්ල.........



සුපසන් මල් බඳුන ගෙන
ඇ සිටින්නී නිශ්චලව
ඇගේ නෙත් මත රැඳී ඇත්තේ
භාවනාවක ශාන්තිය.....
ලොවම සසලව ගියද
නිර්දිටන තබා සිත තුළ
මේ මග දිගේ යන්න
විද්‍යාව සොයා
ප්‍රඥාව සොයා
ආලෝකය සොයා......!

අවර්ණ ආලෝකය ප්‍රිස්මයකට වර්ණ කිරීමට හැකි නම් අපට ප්‍රිස්මයක් වීමට නොහැකි වුවත් ප්‍රිස්මයක් මෙන් සිතීමට හැකිය.



## හංසරාජිනියකගේ දෛවය



නිසල සිඳු පිට නිතින් සරනා
නිමල ධවල පියපත් සලා
ඉඳුනිල් දෙනයන කැලුම් විහිදා
බලා උන්නා හංසරාජිනියක්
වඩින තුරු දුරු ගුවන් තල මතට
මුදු චන්ද්‍ර රජිඳාණන්...

නෙක තාරකා අඟනන් පිරිවරා
වැඩියා සඳ කුමරු ගුවන් තලයට
රන් වණින් දිසි ඒ වුවන දුටු
තිසර කුමරිය...
සිතින් පෙම් බැන්දා
චන්ද්‍ර රජිඳුට
කොපුල් තල හස මලින් සරසා
බලා උන්නා චන්ද්‍ර රජිඳුන්
තම නුවන් වෙත සුදු මුදු වුවන
යොමනා තුරා

තමා වට සිටිනා රැඟුම් දෙන
තාරකාවන් දෙස ඇසිපිය නොලා
බලා හිඳිනා විනා
චන්ද්‍ර කුමරුන් නැතේ කිසිවිට
සුකෝමල රණ තිසරි දෙස බැලුවේ

ළයේ උතුරන සෝ සුසුම් කඳ
දරා සඟවා රුවා ගෙන ඈ
සැනසුණා මේ ලෝ තලය මත
සදා නොමියෙන
දහම මේ මැයි සිතා.......

**කේතකී නිරෝධා නවමිණි**
**13 - එම්**

## උදෑසනක ඇසිරිය

හිරු කුමරා කඳු අතරින් එබී බලන්නේ
චූටි චූටි මල් පිබිදී සුවඳ දෙමින්නේ
හරි ලස්සන කුරුලු පැටව් අර පියඹන්නේ
පරිසරයම අසිරිමත්ය සුන්දර උදයේ

මුළු අහසම හිරු එළියෙන් කහ පැහැ ගන්නේ
පුංචි ළමයි සුදු ඇඳුමින් පාසල් යන්නේ
පොඩි පිණි බිඳු මුතු ඇට සේ ඇයි දිලිසෙන්නේ
උදෑසනක අසිරිය ඉන් වැඩි කරමින්නේ



**එස්.ඒ. බිනංගා මිහිනදී දිසානායක**
**7 ශ්‍රේණිය A**

## ළමා විය සිහි වී.......



දුවේ මං පුංචි කාලයේ
පඩියේ ඉඳන් ගෙයි ඉස්තෝප්පුවේ
අත්තම්මාගේ රස කතා අසමින්
විඳි සෙනේ සුව දැනේ අදටත්

පුංචි මල් මල් ගවුම ඇඳගෙන
කොණ්ඩ කරලත් දමා පිට මැද
තාලයට කවි පන්ති ගයමින
පැද්දෙ ඔන්චිලි නැඟණි සමගින

ඉරටුවේ බත් ඇටය ගහලා
හූනන්ට බත් දුන්නේ පැනලා
දෙපයෙ දැවටෙන පූසි දැකලා
ගුණය කරුණා හදේ වැඩිලා

අසල නිවසක මිදුලෙ රොක් වී
බට්ට පැන්නා ළමුන් එක්වී
අද ඇතත් ඒ සැවොම වෙන්වී
කඳුළු මතුවෙයි එදා සිහි වී

පේර රඹුටන් ජම්බු ඉදිලා
ඉඳුණු දම් ගෙඩි කටේ පිරිලා
උදේ දාවල් ඒවා කෑවත්
බේත් බිව්වද ලෙඩක් හැදිලා

**චම්පා රණබාහු මිය**

## ගුරුතුමියට.......

අඳුරු වී නිල් අහස
වැහි වලා නැඟී නැඟී
මේඝ ගර්ජනා මැද
දිය දහර
මිහිකතට
පතිත වෙද්දී
නොසෙල්වුණ මහ රුකක්
පරිද්දෙන් ආදරෙන්
මනුලොවේ කම්කටොලු දරාගෙන
පය ගසා සිටියෙ ඔබ

කඳුලු බිඳු දෙකම්බුල් තෙමාගෙන
සාරි පොට එල්ලෙමින්
මවු පහස සොය සොයා
හඬ දෙද්දී
දෙතන කිරි නොපෙව්වට
මව වෙලා සිටියෙ ඔබ
මතකයට එයි අදත්
මග දිගේ බොහෝ දුර ආ නමුත්
හැරී බැලූ කල යළිත්
ඔබ දෙසට නෙත් යොමුකොට
කුඩුද මා ඔබ අසල මොනතරම්

**සඳුනි මහේෂිකා**
11 - F

## උදෑසනක අසිරිය

උදෑසන ම රන්පාටට ඉර පායනවා
පුංචි පුංචි මල් කැකුළුත් විකසිත වෙනවා
කුරුලු පැටව් කිචි බිචි ගා ගීත ගයනවා
මද සුළඟින් ගත ද මෙන්ම සිත ද නිවනවා

සමනලයින් මල් වතු වෙත පියඹා යනවා
මී මැසි බඹරුත් ඒ දෙස පියා සලනවා
කුරුලු අම්මා කෑම සොයා පියඹා යනවා
කුරුලු පැටව් අම්මා දැක තුටින් නටනවා

මල් වත්තේ සමනලයින් පියා සලනවා
මී මැසි බඹරුත් වත්තේ පියඹා යනවා
සුදු ඇඳගත් පුංචි ළමෝ පාසල් යනවා
උදෑසනක අසිරිය මින් කැපී පෙනෙනවා

**එම්.එච්.ආර්. මීනු මෙතාසා හේමචන්ද්‍ර**
**7 ශ්‍රේණිය E**

## කඩඉම අභියස

Results

**අනාගතය මිට මොළවා**
**බලා සිටිමි ක්ෂිතිජය දෙස**
**කාලය පැමිණෙන තෙක්**
**දනිමි. නිමා නොවන බැව් ක්ෂිතිජය**
**අධ්‍යාපනය නම් වූ.....**
**හිඳිමි.**
**බිය නම් වූ රකුසාද - හිතැතිව**
**කඩඉම අභියස...**
**උ/පෙළ නම් වූ**
**මඟ බලයි.**
**මා එනතෙක්**
**පසුතැවීමට ඉඩ නොතබමි**
**දෛවය මා සිතැඟි සපල කරන බැව් දනිමි.**
**නමුදු නොයිවසිල්ලෙන් තවම - මා**
**කඩඉම අභියස...**

ඩබ්.ඒ. චතුර්යා දෙව්මිණි
12 - L (කලා අංශය)

## මීයෙකුට හසු වූ පූසෙක්



හොර කිටියා මෝඩ එකා
පවුලේ සුරතල් පූසා
මහත ඇඟයි කොට නැට්ටයි
කළු වයිරන් ඇඟ පුරාම

දිනක් පුංචි මී පැටියා
කෑමට අහරක් සෙව්වා
හොර කිටියා ළඟ පාතම
කියලා මීයා දැක්කා

'දෙන්නම් අද තරු පෙන්න'
මීයා හෙමිහිට මුමුණා
ලිප් බොක්කේ දිළෙන අඟුරු
සිහියට නංවා ගත්තා



මීයා දුටු හොර පූසා
උඉ කොටු වී ඇත සිතුවා
එකවර පය ඔසවාලා
ලිප් බොක්කට පැන නැග්ගා

'ඥාව් ඥාව්' හොර පූසා
මහ හයියෙන් හූ තිබ්බා
ඒ බව දුටු මී පැටියා
බඩ අල්ලන් හිනා වුණා

**කේ.ඒ. සියුමි සන්සලී**
9 - C

## Cristiano Ronaldo



Cristiano Ronaldo is a portuguese Football Player. He was born in 1985. His father was a gardener and mother worked as a Cook. When he was 14 years old, he decided to concentrate on becoming a professional football player. Finally he became the fastest player to reach the 200 goals.

**Bihansa Damsuvi Karunarathne**
**Grade 7 - C**

11 පිටුවට

වල් පැළෑටියත් වනාන්තරයේම කොටසකි. ඔබේ දුර්වලතාද ඔබේ ශක්තියේ කොටසකි.

10 පිටුවෙන්

# බුදු හිමියනි යළි වඩින්න



සාමයේ මල් වැල් පිපෙන්නට ගත වුණේ නැත මහ  කලක්
කාලයේ මැව් නිදහසට ඇස්වහක් වැදුණාදෝ  යළිත්
එක්ව සැමදෙන එකම හුස්මක් ගත යුතුයි පැවසූ  නමුත්
වඩිනු මැන යළි හිමියනේ බුදු නිවන්නට මේ දුක්  තැවුල්

සාමයයි නිදහසයි ගිනිගෙන දැවී යයි එක  මොහොතකින්
කඳුළමයි ඉතිරිව ගියේ ඇසිපිය ගසන එක  මොහොතකින්
රෝහිණී ගං නදියෙ ජල බිඳ බෙදා දුන්නා නම්  ඉතින්
තෙමනු මැන බුදු  හිමියනේ අප ලොව් තුරා දම්  සිසිලසින්

රටේ ලොකු ලොකු තැන්වලට සාමයේ වැදගතකම්  නැතත්
මුදලටම මුළු රටම විකුණා දැමිය හැකි ඒ කා  හටත්
සාමයට ගල් ගසා මේ සැම සතුටු සව්දිය පිරූ  නමුත්
නොහැක බුදු හිමියනේ ඉන්නට මව් බිමයි මේ අප  උපන්

එක්ව සැමදෙන අලුත් ලෙසකට සිතමු රට ගැන  සෙනෙහසින්
හුස්ම පොද යන තුරාවට සිරිලක් මවට සලකමු  බැතින්
සිහල, මුස්ලිම්, ද්‍රවිඩ, බර්ගර් බැඳගනිමු අත් එක  ලෙසින්
ලැබෙයි ආසිරි නැතිව අඩුවක් වැඩිය සේ ලොව්තුරු  බුදුන්

**එස්. හිරුණි පූර්ණිකා** 13 - M

# මව් සෙනෙහස

කිරි සුදු පැහැයට හරවා ලැබ දී සිරුරෙහි ඇති රත් වන්  රුහිරු
සිය පණ නල වන් දරුවන් යහමින් වඩවන්නට පෙම් දිය  ඉහිරූ
සෝ දුක් කඳුළැල් අවමන් හමුවේ විසල් රුකයි නොසැලෙන  මහරූ
ලොව නිති පවතියි අමිල සෙනේ මව්තුමියක දරුවන් වෙත  පැතිරූ

අවමන් නින්දා ගැරහුම් නියතයි සැමටම මේ රුදු දිවි  ගමනේ
එබැවින් දොම්නස හමුවේ නොසැලී පෙරටම ඔබ යා යුතු  වන්නේ
යනුවෙන් දරුවන් පෙරටම යවනට සෙනෙහෙන් ඔවදන් ලැබ  දෙමිනේ
පතමින් මතු දින හසරැලි පිරි දිවියක් දරුවන් හට තුටු  සිතිනේ

කයෙහි ඇට මස් නහර පසු කර සෙනෙහෙ පිරි හදවත  කරා
දිවෙන දරු පෙම මෙපමණකි යැයි කිව හැකිද මුළු දිවි  තුරා
උතුම් දරු පෙම නිසාවෙන් හොඳ නරක එක සේ විඳ  දරා
ලබා දෙන මව් සෙනේ සිහි කරනෙමුව අප සැම නිදි  වරා

අදර හැඟුමන් ළයෙහි දරමින් ලොවක් සැනසූ මව්  සෙනේ
දිවිය රඳනා රක්ත රුහිරය මිහිරි කිරි කළ මව්  සෙනේ
දරු පෙමින් නිති වෙළී ඇති මිහි මඬල නැළවූ මව්  සෙනේ
අනුපමේයයි පූජනීයයි සදා පුදනෙමු මව්  සෙනේ

මහමෙරක් සේ උසුලමින් බර ගෙවූ දිවි මඟ සැම  දිනේ
බිඳක් තරමට දැනුණේ කාටද කිව හැකිද එය කිසි  දිනේ
දෙනෙත් නොපියා රැක්කේ ඔබ අප ඔබේ පණ මෙන් සැම  දිනේ
අපේ ලෝකය දිනා ගන්නට දිවි තුරා දුනි මව්  සෙනේ

**ජී. තරුෂි මයංකා වික්‍රමරත්න**
9 - B

# මල් කැකුළක්...

දුන්නු ජීවිත ගණන අපමණ
සැරිසරා ලෝ වටා මදනල
රැකගන්න දෑත් ඇගේ පණනල
මහා ජීවිත සටනකට බැස

ඇගෙන් ගත් ජීවිතේ ණය බර
ගෙවන්නට දුන් ආසි ඇයටම
තවත් ජීවිත කුසුමකට ඇය
දිවිය දුන්නා අරුම විලසට

නැග යමින් පියගැටෙන් ගැටයට
විකසිත වෙන්න කුසුමට - නිදහසේ
දුන්නේ නෑ මේ සමාජෙන් ඈට
වැටුණි උණු කඳුළැලි දෙකොපුලට

අරලියා මල් සුවඳින් කිතිකැවෙන නහයට
සිමෙන්තිය මත දිලෙන ආලෝකයට
වැහි බිංදු මෙන් වැටෙන කඳුළැලි වලට
නැතිද කව්රුත් මග කියන්නට

ලෝකේ ලස්සන යැයි කියා
පිපුණා සුන්දර මේ ලොව යැයි සිතා
කව්ද සිතුවේ මෙලෙසට
මල් කැකුළ මිලිනව ගියා........

**කේ.එම්.ආර්. තිසත්මා**
9- C

# හුදෙකලා මහලු විය



දිවි ගමනේ ඉසිඹුව වෙත
පිය නඟන්න ආවා
මහද දැවෙන මිහිරි මතක
සැනසිලි ගති පෑවා
රිදී වළා පෙරා එව්ව
සඳ දිය මම බීලා
මතින් සතුටු වුණ කාලය
දැදුරු වෙන්න පාරා
හුදකලාව මහලු වියට
පාර කියනා සෝබා
ජීවිතයේ සරතැස නිවු
හිමියන් මා දමා
සරා සඳට පෙම් බඳින්න
තරුවක් වී ගියා
සකුණ මියැසි හඬ නොඇසෙයි
පියාඹන්න බැරුවා
හුදලකලාව මාත් සමඟ
ආදර බස් දෙඩුවා
අරවින්දය සුවඳ එවනු
හුදකලාව නිවලා

**එච්.ආර්. නවින්ද්‍යා කාවින්දි**
13 - M

# හරි පුදුම කතාවක්



තනි මකන රිසින් හිරු නොමැති රෑ  අහසට
පැමිණ සඳ දිළිසුණේ කෙලෙස රන්  පාටට
ඒ කිසිත් නොම දැනම ඇගේ පින්  පාටට
පෙම් බැන්ද අය පුදුම වෙයි මේ  කතාවට

තාරකා පිරිවරා දිළිසෙමින්  තිබුණට
වල ගොඩැලි ආවාටයෙන් පිරුණු  හඳකට
එළිය දුන්නේ හිරුයි ඔබ නොදැන  හිටියට
සඳට මෙන් සිසිලසක් හිරුට අත්  නොවුණට

මුළු දවස වෙහෙසෙමින් ලොව එළිය  කෙරුවට
රෑ අඳුර දුරලන්නට සඳට සවි  දුන්නට
සඳට තාරකා ඇති මෙන් හිරුගෙ  තනියට
වලාකුළුවත් ඉන්නෙ දවසකට  ඉඳහිට

ලෝකයට පෙනෙන්නට සිනාවී  සිටියද
හදවතින් දුක් ගොඩක් දරාගෙන  හිරු අද
තමාහට කිසිදෙයක් ලැබෙන්නේ  නැතිවද
ලෝකයට ඉටු කරන මහ මෙහෙය  දුටුවද

බොහෝ අය මුලා වෙති පිටින් ඇති  ඔපයට
කවුරුවත් මනින්නට නොහැක පිට  පෙනුමට
හැකිවුණොත් සියල්ලෙහි ඇති තතු  දකින්නට
සුදුසු අය වෙත ලැබෙයි සුදුස නැත  එම විට

**චතුනි හිරුෂි**
11 - C (2019 සා/පෙළ)

# My Favorite meal



There are three meals: breakfast, lunch and dinner. But my favorite meal is breakfast. I eat rice and curry or milkrice or string hoppers or hoppers or greengram etc. for my breakfast. My favorite food is milkrice. I have my breakfast at 7.00 a.m. everyday. My mother prepares my breakfast.

Breakfast gives us energy to work well. Our breakfast contains nutrients. They are, carbohydrate, Proteins, Minerals and fat. They help to give a healthy body. Everybody must take the breakfast everyday.

**W. Amanda 7 - F**

12 පිටුවට

**ප්‍රශ්නයක් ප්‍රශ්නයක් වනුයේ එයට පිළිතුරු සෙවීමට උත්සාහ ගන්නා තාක් කල් පමණි.**

11 පිටුවෙන්

# මනු සතුනේ

සඳ පිනි දිය
සොය සොය තැවෙන
කිසිදා නොලැබෙනා
දේ වෙනුවෙන්
හඬ හඬා වැළපෙනා
මනුසතුනේ.....

කොහෝ සිටන්දෝ
ආවේ නොදන්නා
යන්නේ කොහේටදෝ
කිසිත් නොදන්නා
කවදා සසරින්
එතෙර වේවිදෝ
සිහි නොම කරනා
කෙලෙස් ගින්නේ නිති දැවෙනා
මනුසතුනේ....

අහස අල්ලන්නට
පොර බදිනා
අන්සතු දේ ගැන
නිති ලොබ බඳිනා
පොළොවේ පය
ගසා ඉන්නට
කෙදිනක හෝ සිතුවාදෝ
මනු සතුනේ....

අනුන් රවටමින්
දිවිය ගෙවන්නෝ
තමාම නිති
රවටා ගන්නෝ
මගේ කියා කිසිවක්
නොම රැගෙනාවෝ
යන්නට යනකොට
නිති බියවන්නෝ
මනු සතුනේ......

තරුෂි මල්ශානි
12 - M (කලා)

# ජල සම්පත



ලෝකයේ සියයට හැත්තෑපහක් පමණ වට වී තිබෙන්නේ ජලයෙනි. ඒ වගේම මිනිස් ශරීරයේ සියයට හැත්තෑවක් පමණ තිබෙන්නේ ද ජලයයි. ඉහත කරුණු අනුව මිනිසාට ජීවත් වීමට ජලය බොහෝ උපකාරී වේ. ඒ වගේම ජලය නොමැතිව දින කිහිපයක් හෝ සිටීමට නොහැක. ජලය යනු මිනිසාට මෙන්ම සත්වයන්ට හා පණ ඇති සියලු ම ජීවීන්ට මහෝපකාරී වන්නකි. ඉහත කරුණු සලකා බැලීමේදී ජලය වටිනා සම්පතක් බව අපට පෙනී යනු ඇත.

ඇතැම් ස්ථානවල 'ජලය ධනය මෙන් සුරකිමු.' යැයි නාම පුවරු ගසා ඇති බැව් මා දැක තිබේ. එහෙත් ජලය යනු ධනයට සමාන කළ හැකි දෙයක් නොවේ. ජලය යනු ඉතාමත් අමිල සම්පතකි.

ඇතැම් රටවල ජලය හිඟය. එවැනි රටවල් කාන්තාර බවට පත්ව ඇත. ඒ අනුව බැලීමේදී ශ්‍රී ලංකාව යනු ජලය නොඅඩුව ලැබෙන්නකි. ඇතැම් රටවල් කාන්තාර බවට පත්ව තිබීම නිසා එම රටවල ජනතාවට ජීවත්වීමට මාර්ගයක්ද නැත. ජලය යනු ඉතා හිඟ සම්පතක් බව ද පෙනී යයි.

ජලය ප්‍රයෝජනයට ගන්නා අවස්ථා කිහිපයක් වේ. එනම් කෘෂිකර්මයට, බීමට, ප්‍රවාහන කටයුතුවලට, බල ශක්තිය නිපදවීමට, සනීපාරක්ෂක කටයුතු සඳහා ය. එමෙන්ම අප ගන්නා ආහාර නිෂ්පාදනය කරන්නේ ශාකයි. එම ආහාර නිපදවීමේ ක්‍රියාවලියට ජලය ද අත්‍යාවශ්‍ය සාධකයකි.

මෙවන් සුවිශාල වැදගත්කමක් ඇති ජලය අප රටට නොඅඩුව ලැබීම අප ලද භාග්‍යයකි. එම නිසා ජලය ඉදිරි පරම්පරාවට හා අනාගතයට ඉතිරි කිරීම අප සතු යුතුකමකි.

අපේ පැරණි මුතුන් මිත්තෝ ජල සම්පත ප්‍රයෝජනයට ගෙන ඇත්තේ ඉතා අරපරිස්සමෙනි. ඕනෑම දෙයක් මේ ලොව සදාකාලික නැත. එනිසා ජලයේ ඇති වැදගත්කම වටහාගෙන කටයුතු කිරීම අනාගතයට අතිශය වැදගත් වන්නකි.

''ජල සම්පත පණ මෙන් සුරකිමු.''

**ටී.එම්. මියුනි සඳිත්මා**
7- C

# මාතෘ භූමිය



ආසියාවේ මුතු ඇටය ලෙස ද පෙර දිග ධාන්‍යාගාරය ලෙස ද හඳුන්වන බොහෝ සම්පත් සපිරි මාගේ මාතෘ භූමිය නිර්මල බුදු දහමින් ද ස්වයං පෝෂිතය. නමුත් දෙමළ, මුස්ලිම්, බර්ගර් යන අනිකුත් ආගම්වලට ද මේ ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය තුළ නිදහස ඇත. අතීත විදේශිකයන් විසින් මාතෘභූමිය සිහල දීප, තැප්‍රොබේන්, තම්බපණ්ණි යන විවිධ භාෂාවලින් ද අමතා ඇත.

බුදුරජාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් වසර 37කට පසු මහින්දාගමනය සිදු විය. ඉන්පසු රජ වූ සෑම රජවරයෙකුම දළදා වහන්සේගේ ආශිර්වාදයෙනුත් දෑතේ වීර්යයෙනුත් දෙවුන්දර තුඩුවේ සිට පේදුරුතුඩුව දක්වා ස්වයංපෝෂිත කළ මාතෘ භූමිය පින්බර දෙරණකි. අහස සිප ගන්නට වෙරදරන්නාක් මෙන් ගොඩනැගුණු මහා දාගැබ් ද මහා සාගර වැනි වැව් අමුණු ද වර්තමානය වන විටත් රටේ ආර්ථිකයට මහා ශක්තියකි.

එදා දිවි ගෙවූ රටවැසියෝ ශ්‍රී ලංකාවේ කුඹුරු අස්වද්දා වීවලින් ස්වයංපෝෂිත කළහ. මහා පැරකුම්බා රජු, දුටුගැමුණු රජු ශ්‍රී ලංකාව සතුරු ආක්‍රමණිකයන්ගෙන් රට මුදාගෙන කළ වික්‍රම ඇසීමට දැකීමට ලැබීමත් මගේ සිතට ආඩම්බරයකි. රත්නපුරයෙන් ලබා ගන්නා මැණික් ද රුහුණේ මී කිරි ද සපිරි මගේ රටේ වෙසෙන ජනයා ඇත්තෙන්ම වාසනාවන්තයෝය. නිල්වල් ගිරිශිඛරවලින් ගලනා මනරම් ගංගාවලින් රටට සිරි කැන්දන් එයි. නමුත් ඒවායින් කිසිම ප්‍රයෝජනයක් නොගෙන මුහුදට යැවීම අනුවණ ක්‍රියාවකි.

පොළොවට වැටෙන එක දිය බිඳුවක්වත් ප්‍රයෝජනයට නොගෙන මුහුදට නොයවන්න යන උදාර ප්‍රකාශ සිදුකළ රජවරු මෙහි සිටියෝය. නමුත් වර්තමානයේ ඒවා ක්‍රියාත්මක නොවේ. එය කනස්සල්ලට කරුණකි.

මහා වැසි වනාන්තර ද නෙත්සිත් ඇදගන්නා සතුන් ද ඇස් අදහාගත නොහැකි කැටයම් හා වාරි තාක්ෂණ මෙහි බොහෝය. ඒවායේ වටිනාකම දන්නා විදේශිකයෝ ඒවා දැක බලා ගැනීමට මෙහි පැමිණෙති. එයින් රජයට මුදල් ලැබේ. මෙවැනි මහා උරුමයකට හිමිකම් කියන අපි එහි ප්‍රයෝජන ගෙන අනාගතයේ කටයුතු කිරීමට අදිටන් කරගනිමු.

**එස්.ආර්.එම්. හෂානි සමංගිකා** 7 - B

තැලෙන්න බය යකඩෙට කිසිදා මුවහත් කඩුවක් විය නොහැක.

# විද්‍යාප්‍රබන්ධය

# සජීවීහු



වර්ෂ දෙදහස් පන්සිය විසිපහක් වූ මාර්තු මස 17 වන දින සූර්ය උදාව සිදුවී සිව් පැයකුත් මිනිත්තු 30කුත් ගත වී ඇත. සූර්යය උදාව සිදුවී දෙහෝරාවක් ගතවීමටත් ප්‍රථම සිය දෛනික වැඩකටයුතු අරඹන රොජර් සැක්ස් මහතා ලෝක ප්‍රකට මැක්ස් ව්‍යාපාර සමූහයේ හිමිකරු ද වෙයි.

සුපුරුදු පරිදි මෙදින ද උදෑසනින් හැඳ පැළඳගත් පනස් දෙහැවිරදි රොජර් මහතා සිය නිවසින් පිටත් වන්නේ දෛනික ව්‍යාපාර කටයුතු සොයාබැලීමටය. තමා ඉතාමත් ප්‍රිය කරන සංගීත ඛණ්ඩයකට සමවැදී පියාපතක හැඩය ගන්නා අධි සුඛෝපභෝගී රථය ධාවනය කරන රෝජර් මහතාගේ සිතුවිලි දැහැන බිඳ දමමින් ඔහුගේ දූරකථනය නාදවන්නට විය. ඇමතුම රෝජර්ගේ ආදරණීය බිරිඳ වන ක්‍රිස්ටිනා ගෙනි.

''සුභ උදෑසනක් වේවා රෝජර්, ඔයා කොහෙද ඉන්නේ?''
''මැක්ස් සෙන්ටර් එකට යනගමන්, ඇයි?.''
''නෑ ඉතින් අද කියන්නෙවත් නැතුව ගියානේ, ඒකයි.....''
''එකම එක මිනිහෙක්වත් නැතුව ඔයා ඔතන ඔය රොබෝලව වට කරගෙන කොහොම වැඩ කරනවද කියලා මට නම් තේරෙන්නේ නෑ.....''
''ඇයි හෙන්රි ඉන්නේ, මට කතාකරන්න'' ඒ හඬ දැගකාරය.

''ඒ ඉතින් ඔයාගේ තේ එකේ පදම දන්නේ හෙන්රි විතරක් නිසානේ. ඔය මනුස්සයා වුණත් දැන් ඔතන වැඩ කරන්නේ ආසාවෙන් නෙමෙයිනේ.....''
''අයියෝ, ක්‍රිස්ටිනා..... නිවාඩුයි අයිතිවාසිකම් ගැනයි කියව කියවා මට වද දුන්නු මිනිස් සේවකයින්ට වඩා මේ රොබෝලා කාර්යයක්ෂමයි. එයාලා මට මුදල්, කාලය ඉතුරු කරලා දෙනවා. ඔයාට ඒක තේරෙන්නේ නැද්ද?
''මන්ද, මට ඕවා තේරෙන්නේ නෑ රොජර්''
''මං මගේ ආයතනේ මිනිසුන්ව අයින් කරලා ඒ වෙනුවට රොබෝලව ගත්තේ හොඳට හිතල බලලා. ඒක ඔයත් දන්නවනේ.

සිය සැමියාගේ ආදරණීය දැගකාර හඬ දැන් දැන් නොරිස්සුම් බවට හැරෙන බව වටහා ගැනීමට ක්‍රිස්ටිනාට අපහසු නොවීය.

''හරි රොජර් මට තේරෙනවා.''
''මං තියන්නම් එහෙනම්''
''හා, මට අද වැඩ ගොඩක් තියෙනවා. මං එන්න ටිකක් පරක්කු වෙයි. අත්‍යවශ්‍ය කාරණයක් නැත්නම් මට කෝල් කරන්නත් එපා.''

ඇමතුම එසේ අවසන් විය. මැක්ස් ආයතනය පියවරෙන් පියවර දියුණු කිරීමට තමාගත් සියලු තීරණවලදී තමා සමඟ සෙවනැල්ලක්ව සිට ශක්තිය දුන් ක්‍රිස්ටිනා මැක්ස් ආයතනයට රොබෝ සේවකයන් පමණක් අනුයුක්ත කිරීමට මෙතරම් විරුද්ධ වන්නේ ඇයි දැයි යන්න රොජර්ට ද මහත් ගැටලුවක් විය. සිතුවිලි අතරම නිමග්නව ආයතන පරිශ්‍රයට ගොඩ වූ රොජර් මහතාට දිස්වූයේ කෘතිම සිනාවෙන් මුව සරසාගත් කඩිමුඩියේ සේවය කරන රොබෝවරුය. හිත්පිත් නැති රොබෝවරුන්ගේ සිනාව පරිපථ සැලසුමක් බවද තමාගේ පිළිතුරු සිනාව ඔවුන්ට ආනන්දයක් නොවන බව ද දන්නා රොජර් මේ අජීවී කාර්යක්ෂම පද්ධතියට ඇතුළු වූයේ මෙහි සිටින එකම සජීවී පුද්ගලයා වන හෙන්රි හමුවීමේ නොහිම් ආශාවෙනි.

තත්පර පැයවලට පත්ව ඉගිල යත්ම උදෑසන නේවාසිකාගාරවලින් පැමිණ සවස 6.00 ට යාන්ත්‍රිකවම නේවාසිකාගාර වෙත ඇදෙන රොබෝවරු වේලාව සවස 5.30 වන බැවින් සිය දෛනික රාජකාරි අවසන් කරමින් සිටිති. දෛනික රාකාරිවලින් අධික වෙහෙසට පත්ව සිටි රෝජර් මහතා සිය රාජකාරී කාමරයේම පවතින නාන කාමරය වෙත ගියේය. ඒ සුපුරුදු වේලාවට බැහැර යාමට ප්‍රථම මුව සෝදා ගැනීමටය නමුත් එකවරම අධික වේදනාවක් සමඟින් සිය පපුව හිරවෙන බව රොජර් මහතාට දැනෙන්නට විය. හදවත වේගයෙන් ස්පන්දනය වත්ම දහඩියෙන් මුළු සිරුරම තෙත්වී ක්ෂණිකව ඇතිවූ වේදනාවක් සමඟ අතපය අප්‍රාණිකව රොජර් මහතා නානකාමරය තුළම ඇද වැටුණි. සිය රොබෝ සේවකයින් සේවාවන් නිමකර පිටතට ඇදෙන හඬ ඔහුට ඇසෙයි. උදව් ඉල්ලා කෑගැසුවද ඒ හඬ ශක්තිමත් නොවීය. ඇරත් තම ආයතන ප්‍රධානියා රෝගීව කෑගසන විට ඔහුට වහා ප්‍රථමාධාර දී රෝහලට රැගෙන යා යුතු බව රොබෝ පරිපථයේ සටහන් නොවන බවද සිහිපත් විය. සවස 6.30 ට ස්වයංක්‍රීයව අගුල් වැටෙන දොරවල් අක්‍රීය නොකළොත් ඒවා විවෘත වන්නේ හෙට උදෑසනය. එතෙක් තමාට ජීවත් වීමට තරම් වරම් නැති බව වටහාගත් රෝජර්ට වහා තම ආදරණීයයන් සිහිපත් විය. සිය පවුල මෙන්ම තමා විසින් රැකියා අහිමි කළ ආදරණීය සේවක මඬුල්ලද සිහිපත් විය.

''සර්, අපි අද වැඩ ඉවර වෙලා ගෙදර යන්න හදන්නේ සර් දැන්ම යනවද?''

සිය දෛනික වැඩමුරය අවසන් කරන ඔවුන් රොජර් හමුවී ආයතනයෙන් නික්ම යන්නේ මෙසේ පවසා සමුගැනීමෙන් පසුය. ඔවුන් සිටියා නම් නිසැකවම තමා සොයා මෙහි පැමිණෙනු ඇත. සිත්පිත් නැති රොබෝවරුන්ට නැති සජීවී හදවතක් ඇත්තවුන් ළඟ ඇති මානුෂීය ගුණධර්ම ඔහුට සිහිපත් වෙයි. දොරවල් ස්වයංක්‍රීයව අගුල් වැටෙන හඬ ඇසෙයි. සිය අප්‍රාණික දේහය සමඟ කළ හැක්කක් නැති බව වටහා ගන්නා රොජර් සිය අවසන් මොහොත වැළඳගැනීමට දෑස් පියාගත්තේය. පාළුව, තනිකම, පසුතැවිල්ල මෙන්ම භීතියද ඔහු වෙලාගත්තේය.

අභ්‍යන්තර තත්ත්වය මෙසේ වුවද ආයතනයෙන් පිටත පරිශ්‍රයේ සිදු වූයේ වෙනත් දෙයකි. සේවක හෙන්රිට නිවසට යන අතරමගදී එකවර සිහිපත් වූයේ රොජර් මහතා තමාට යන බව පවසා සමු නොදුන් බවය.

සවස් වරුවේ රොජර් මහතා නුදුටු බැවින් යළිත් ආයතනයට පැමිණ රථගාල පරීක්ෂා කරන විට රොජර් මහතාගේ පියාපත් රථය දුටු නෙහ්රි මහතා ක්‍රිස්ටිනා මහත්මියට දුරකථන ඇමතුමක් ගත්තේය.

''හෙලෝ, නෝනා,
මම හෙන්රි,
මහත්තයා අද ගෙදර ආවද?''
''නෑ, හෙන්රි. අද එයා එන්න පරක්කු වෙනවා කියලා කිව්වා හුඟක් වැඩ කියලා මට කෝල් කරන්නත් එපා කිව්වා.
ඇයි.... ඇයි.... හෙන්රි, මොකද වෙලා තියෙන්නනේ?''

''නෑ, නෑ, නෝනා...., හරි, හරි මං නෝනට කතා කරන්නම්කෝ''

ඉක්මනින් ඇමතුම විසන්ධි කළ හෙන්රි, රොජර් මහතා ගැන බෙහෙවින් දන්නා බැවින් ක්ෂණිකව සිදු වූ දේ වටහාගත්තේය. වහා හෙන්රි පොලීසියට ඇමතුමක් ගන්තේ සිය ප්‍රධානියා ආයතනය තුළ සිරවූ බව පැවසීමටය. සැණෙකින් පැමිණි ආරක්ෂක භටයෝ ආයතනය තුළ උඩුබැලි අතට වැටී සිටි රොජර් මැක්ස් මහතා දුටු අතර ඔවුහු ඔහුව වහා ගිලන්රථයක නංවා ඉක්මන් ප්‍රතිකාර සඳහා වහා රෝහලට රැගෙන යන්නට වූහ.

.........................

අද මනුෂ්‍යත්වයෙන් පිරි අපි තාක්ෂණය සොයා යන්නෙමු.
නමුත් හෙට.....?

තාක්ෂණයෙන් පිරි අපට මනුෂ්‍යත්වය සොයා යන්නට සිදු වේවිද?

**ඩබ්. කාවින්දි දෙව්මිණි ජයවර්ධන**
**12 - A විද්‍යා අංශය**



# විශ්ව භාෂා

## Dans la Cour de l école

Pendant la récreation, les éléves s'amusent dans la cour. Bruno joue aux billes avec Alex. Amélie et sofia préférent et Alain jouent au chat et à la Souris. Lucien S'amuse au ballon. Marie. Saute à la corde. Héléne, Janine et moi, nous jouons à Cache cache. Le reste de la classe Se divertit Sur le toboggan. Quelle ambiance!

## Traslation In the School Play Ground

During the interval, the Students have fun in the yard. Brono Plays marbles with alex. Amelie and Sofia play hide with Alain and Alain play cat and mouse. Lucien has fun with the ball. Marie jumps to the Card. Helene, Janine and me, we play hide and seek. The rest of the class is entertained on the slide. What is our ambition.

**Sharmila Sandaruwani**
**13 - K**



## The Importance of English

English is very important for all people. Because it is the most popular language in the world. English language is used as a linking, business and international language in the word. If we know English, We can get many benfits from the society. If we know English we can go abroad for seeking foriegn jobs and we can find a job easily. So English language has become the mother tongue of some countries.

At present, if we want to follow our higher studies, we should know English. Because many books have been written in English. So we can't read them without English. Then all people should learn English. Learning English would be a better investment in our future.

**D. Janudi Chamodya**
**10 - E**

## Importance of Education



Better education is very necessary for all to go ahead in the life and get success. It develops confidence and helps building personality of a person. School education plays a great role in everyone's life. The whole education has been divided in to three divisions such as the primary education, Secondary education and higher secondary education. All the divisions have their own importance and benefits. Primary education prepares the base which helps throughout the life, Secondary education prepares the path for further study and higher secondary education prepares the the ultimate path of the future and whole life. Our good or bad education decides that which type of person we would be in the future.

**Sanduni Maheshika 11 - F**

03 පිටුවෙන්

## ජය දද නැංවූ යසෝදරාව...

## අන්තර් පාසල් ඡායාරූප තාක්ෂණික කුසලානය දිනා ගැනේ

කොළඹ නාලන්දා විද්‍යාලය මගින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන අන්තර් පාසල් ඡායාරූප තාක්ෂණික තරඟයේදී ඔරිෆීස් 2019 (ORIFICE - 2019) කුසලානය හිමිකර ගැනීමට යසෝදරා දේවි බාලිකා විද්‍යාලයීය ඡායාරූප සංගමයේ ශිෂ්‍යාවෝ සමත් වූහ. රසිකා සිරිවර්ධන ගුරු මහත්මිය ඇතුළු ඡායාරූප සංගමය භාර ගුරු මහත්ම මහත්මීහු ශිෂ්‍යාවන් ජයග්‍රහණය කරා මෙහෙයවූහ. ඉදිරි ජයග්‍රහණ සඳහා උණුසුම් සුබ පැතුම්.



## රාජ්‍ය ළමා චිත්‍ර උලෙළේදී විශිෂ්ට කුසලතාවක්

2019 රාජ්‍ය ළමා චිත්‍ර උලෙළේදී "විශිෂ්ට කුසලතා" ජයග්‍රහණයක් හිමි කර ගැනීමට 13 ශ්‍රේණියේ පාරමී අසේනිකා ශිෂ්‍යාව සමත් වූවාය. හේමමාලි හේනකආරච්චි ගුරු මහත්මිය ඇතුළු චිත්‍ර අංශයේ ගුරු මහත්මීහු ජයග්‍රහණය වෙනුවෙන් ඇය දිරි ගැන්වූහ. චිත්‍ර අංශයේ ඉදිරි ජයග්‍රහණ සඳහා මෙසේ සුබපැතුම් පිරිනමමු.

## මිහිකත සුරකින තුරුලිය රැක ගනිමු



මිහිකත නම්, මිනිසා ඇතුළු ලොකු කුඩා සියලුම සත්වයන්ගේ ජීවයට පණ දෙන්නා වූ තුරුලතාවන්ගේ නිවහනයි. එබැවින් මිහිකත සුරැකීම අප සැමගේ කාර්යභාරයක් වේ. මිහිකත සුරකින ප්‍රධානතම ආරක්ෂකයා වන්නේ තුරු ලතාවන්ය.

ලෝකයේ සංවර්ධනය පවත්වාගෙන යාමට මෙන් ම ලෝකයේ ජීවය පවත්වා ගෙන යාමට තුරුලිය ඉතා වැදගත් වේ. විවිධ සම්පත් සමූහයක එකතුවක් ලෙස ගස්වැල් සැලකිය හැකිය. එසේම තුරු සම්පත මිනිසා ජීවත් කරවීමට විවිධ සාධකයන් සපයන බව බොහෝ දෙනෙක් ගැඹුරින් කල්පනා නොකරති. එමඟින් සැලසෙන සෙත ගැන කරුණු නොදන්නා නිසා බොහෝ දෙනා තුරු සම්පත විනාශ කිරීමට වෑයම් කරති.

මිහි මත ජීවයේ පැවැත්මට අවශ්‍ය කරන ඔක්සිජන් වායුව ලබා දෙන්නේ ශාක ප්‍රජාවයි. එමෙන්ම පෘථිවිවාසී සියලුම සත්වයන් හට ආහාර ලබාගත හැකි වන්නේ තුරු සම්පත නිසාය. ජීවීන්ගේ මූලික අවශ්‍යතා ගණයට අයත්වන තවත් එක් සාධකයක් නම් ජලය වේ. ජල සම්පත සුරැකීමෙහි ලා ශාක විසින් ඉටු කරන කාර්ය භාරය තුරු සම්පතෙහි තවත් එක් ප්‍රයෝජනයක් වේ. ජල උල්පත් ආරක්ෂා කිරීම, භූගත ජලය ආරක්ෂා කිරීම සහ ගංගා ඇළ දොළ සිඳී යාමට ඉඩ නොදී පවත්වා ගැනීම මේ සඳහා කළ හැකි දේ වේ.

තුරුලතා විනාශ වීමෙන් ගෝලීය උණුසුම ඉහළ යයි. ගෝලීය උණුසුම යනු අවට පරිසරයේ ඔක්සිජයන් වායුව අඩුවී ගොස් කාබන්ඩයොක්සයිඩ් වායුව වැඩි වීමයි. මෙයින් පරිසරයේ උෂ්ණත්වය වැඩි වී වායු දූෂණය සිදු වේ. ගෝලීය උණුසුම වැඩි වීම ලෝකයේ සියලුම ජීවීන්ට හානිදායක වේ. තවද තුරුලතා විනාශ කිරීමෙන් කාන්තාරකරණයද සිදු වේ. කාන්තාරකරණය යනු, ගස් වැල් කපා දැමීමෙන් වායුගෝලයේ උෂ්ණත්වය වෙනස් වී ගංගා, දිය ඇළි, උල්පත් සිඳී ගොස් භූමිය කාන්තාරයක් වීමයි. මෙයින් ආහාර, ජලය, සෙවණ නොමැතිව මිනිස්සු හා සත්ත්වයෝ මිය යති. මේ අනුව අප හට පෙනී යන්නේ දියතෙහි පැවැත්මට තුරුලිය නැතුවම බැරි සාධකයක් බවයි.

ග්ලැසියර් දිය වීමත් ලෝකයෙහි පවතින ප්‍රධානතම ගැටලුවකි. ග්ලැසියර් දිය වන්නේ තුරුලිය කපා දැමීමෙනි. මෙහිදීද වායු ගෝලයේ උණුසුම ඉහළ ගොස් ග්ලැසියර් දියවී ඒවා මහා සයුරට එකතු වේ. එයින් තවත් අර්බුදයක් හට ගනියි. එය නම් කරදිය ජල මට්ටම ඉහළ යාමයි. ග්ලැසියර් දිය වී සාගරයට එක් වන ජලයෙන් මාලදිවයින වැනි කුඩා දූපත් යට වේ. එමගින් ලෝකයෙහි ගොඩබිම් ප්‍රමාණය අඩු වී මුහුදු මට්ටම ඉහළ යයි. මෙම ගැටලු සියල්ලෙන් ම සිදු වන්නේ පරිසරයෙහි සමතුලිතතාව බිඳ වැටීමයි. මෙවන් වූ විනාශයකට තුඩු දෙන හේතුව වන්නේ ගස් වැල් විනාශ කිරීමයි.

සැප්තැම්බර් මාසයේ විසි හය වැනිදා ජාතික රුක් රෝපණ දිනය වශයෙන් නම් කර ඇත. එවැනි ක්‍රමෝපායන් මගින් ගස්වැල් සුරැකීමට මිනිසා උනන්දු කර ඇත. මිහිකතෙහි පැවැත්මට විශාල මෙහෙවරක් කරන තුරුලිය රැක ගැනීමට අපි වසරකට නියමිත ප්‍රමාණයට පැළ සිටුවිය යුතුය. පරිසර දූෂණය වැළැක්විය යුතුය. රටේ නීති දැඩි කළ යුතුය. එවිට නිල්ල ගැසුණු තෘණ මිටියාවත්, හරිත වර්ණ වනාන්තර හා මල් එලවලින් හරිත වූ රුක් සහිත උද්‍යානවලින් මුළු දියතම වර්ණවත් වේවි.

අපගේ ජීවනාලිය වන් තුරු සම්පත රැක ගැනීම අප සැමගේ කාර්ය භාරයක් මෙන්ම වගකීමක් ද වේ. එවන් තුරු සම්පත සුරැකීම මගින් නූතන පරම්පරාවට මෙන්ම අනාගත පරම්පරාවට ද මිහිමව සොඳුරු නිවහනක් වනු නිසැකය.

පී. නිසල්නි සචිත්මා 7 - A

## උදෑසන අසිරිය



කන්ද උඩින් පායන හිරු කුමරා මුළු ලොවම එළිය කරයි. තණ මත ඇති පිණි බිඳු මත හිරු කිරණ පතිත වී මුතු පලසක් දේ දිස්වෙයි. උදැල්ල හා කැත්ත කරේ තබා ගෙන යන ගොවියා පරිසරයේ සුන්දරත්වය වැඩි කරයි. කැදලිවලින් නික්මෙන කුරුල්ලෝ කෑම සොයා පියාඹන්නේ රූ රටා මවමිනි. හිරු කිරණින් පහස ලැබූ මල් කුමරියෝ විකසිත වී දසතම සුවඳ පතුරති. කුරුල්ලන්ගේ කිචි බිචි නාදයෙන් උදෑසනින්ම අවදි වූ මිනිස්සු තම දෛනික වැඩ කටයුතු ආරම්භ කිරීමට සූදානම් වෙති. තුරුලතා පිස හමන සිසිල් මඳ නල ගත සිත ප්‍රබෝධවත් කරයි. මුළු ලොවම සුරපුරක් බඳු ය.

එච්.ඒ. හසලි ප්‍රියහංසි
7 - D

## ගෘහවිද්‍යාගාරයෙන් රස පණිවිඩයක්...

## මොක් වටලප්පන්

උත්සව අවස්ථාවකදී හෝ සාමාන්‍යයෙන් නිවසේදී ප්‍රධාන ආහාර වේලකට පසුව ගන්නා අතුරුපසක් ලෙස ඔබ වටලප්පන් ආහාරයට ගෙන ඇති. නමුත් නිර්මාංශ අයෙකුට එහි රස බැලීමට නොහැකි වී ඇත්තේ වටලප්පන් සඳහා බිත්තර එකතු කිරීම නිසාය. නිර්මාංශ අයට මෙන්ම අනෙක් අය සඳහා ද සුදුසු අතුරුපසක් ලෙස මොක් වටලප්පන් හැඳින්විය හැකිය.



**අවශ්‍ය ද්‍රව්‍ය :**

- උකු පොල්කිරි අඩු කෝප්ප - 2
- කිතුල් හකුරු - 200g
- ජෙලටින් කපාපු මේස හැඳි - 1 ½
- වැනිලා ස්වල්පයක්
- තලාගත් කරඳමුංගු කුඩු තේ හැඳි - 1
- කජු මද කිහිපයක්
- උතුරන වතුර අඩු කෝප්ප - 1/4

**සාදන ක්‍රමය :**

උතුරන වතුර අඩු කෝප්ප 1/4ක ජෙලටින් ටික දිය කර ගන්න. හකුරු ඉතා සිහින්ව සූරා ගන්න. බඳුනකට පොල්කිරි දමා එය හකුරු ද එක්කර හොඳින් මිශ්‍ර කරන්න. කරඳමුංගු කුඩු ද එයට එකතු කර ලිප තබා හොඳින් රත් කරන්න. පැසීගෙන එනවිට දියකරගත් ජෙලටින් ටිකද එකතු කර හොඳින් හැඳි ගාන්න. ලිපෙන් ඉවත් කර නැවත හැඳි ගා බඳුනකට දමන්න. (වීදුරු බඳුනක් නම් ශීත කළ පසු ලස්සනට පෙනේවි) මිශ්‍රණය නිවුණු පසු උඩින් කජු මද කැබලි ඉසින්න. ශීතකරණයේ තබා හොඳින් සවි වූ පසු රස බලන්න.

අයි.එල් හෙට්ටිආරච්චි මිය
ගෘහ විද්‍යා අංශය

ගෞරවය ලබා ගැනීමට නම් ගෞරවය ලබා දිය යුතුය.

# තෙමසක සැමරුම් අතරින්....






පිරිත් නදින් ලොව නිවී සැනහී.... | දන් බෙදමු පින් පුරමු.... | පිරිතෙන් ජය පතා සා/පෙළ සිසුවියන්ට ආසිරි ගෙනෙමින්..... | සුපසන් සිතින් ගුරු පා වඳිමි....






කලාවේ උත්කර්ෂය සරසාභිනන්දනී.... | සිසු නයුවන් අභිසෙස් ලබා | අත්කම් ප්‍රදර්ශනයේදී..... | ඉංග්‍රීසි බසයි සිසු මඳහසයි (ඉංග්‍රීසි කඳවුර)






ලෝක ළමා දින සැමරුම ළමා සිතට දෙයි සැනසුම..... | සම්මා සතියයි සිත රැඳි සුවයයි... (සතිපාසල වැඩසටහන) | පෙරපොහොය වැඩසටහන...






සිතුවම් අඳිමු නෙත් මත - දී නව ඇසක් ලෝකෙට.... (චිත්‍ර හා ඡායාරූප ප්‍රදර්ශනය) | වාණිජ විදු එළියෙන් දස්කම් විස්කම් පිබිදේ.... | "යසෝමල් යාය" ප්‍රාථමික අංශයේ විවිධප්‍රසංගය






හරිත තුරු අරණේ සුවය විඳිනෙමු මෙලෙසේ....(පරිසර ප්‍රදර්ශනය) | චෙස් තරගාවලියේදී බුද්ධියේ නව මං සොයමින්.... | නිරෝගී දිවියකට එන්නතින් දෙන සුවය....(සෞඛ්‍ය කඳවුර) | රිද්මයයි විශ්වයේ ශක්තිය... (නාට්‍ය තරගාවලිය)



Deepana Printers - Gmpaha - 033 2226913